# සිසිල

සිනුවර සිංහල සාර සංග්‍රහය

**බලන්නට නොව කියවන්නට ය!**

*Sisila Sinhala eMagazine*

සිව්වෙනි වෙළුම – දෙවෙනි කලාපය – ඔක්තෝබර් 2024 :: **Volume 4 – Issue 2 – October 2024**



නීතියේ අභිමුව සැම එක ලෙසට සැළකෙන
ඇති-හැකි මිනුම වියැකී සැමට සම තැන සුරැකෙන
සිප් සතර අගැයෙන, දූෂණය නිමවෙන
හිරු උදා වෙමින් ඇත, මේ ය පුනරුද ඇරඹුම!

නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ ප්‍රකාශනයකි

Sisila electronic magazine is published and distributed by the Writers Guild of Sinhalese Cultural Forum of NSW, Australia.

sisila.sangarawa@gmail.com

sisilamagazine.blogspot.com

ISSN: 2653-2182

# සිසිල - සිනුවර සිංහල සාර සංග්‍රහය

**සිව්වෙනි වෙළුම – දෙවෙනි කලාපය – ඔක්තෝබර් 2024 :: Volume 4 – Issue 2 – October 2024**


## සිසිල පෙළ ගැස්ම


මේ ජනාධිපතිවරණය ම ජයග්‍රහණයක් - පාලිත ගනේවත්ත

ජයග්‍රහණය (කවි) - පාලිත ගනේවත්ත

උදුම්බරා (කෙටිකතාව) - ඉන්දිකා තිලකුමාර

තනිය (කවි) - ඉන්දිකා තිලකුමාර

මා ඡන්දයදීමට අපේක්ෂකයින් තෝරාගන්නේ මෙහෙමයි!
- රසික සූරියආරච්චි

මාල පබලු වැල් කරවටලන්නට - කරුණාසේන කහටපිටිය

සමබරතාව (කවි) - දක්ෂිණී සාවිත්‍රි ප්‍රනාන්දු ද සිල්වා

සෙනෙහස (නවකතාව) - දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ

කුමාරයෙක් (කවි) - ඩී අමරසිරි ගුණවර්ධන

සිසිල ප්‍රහේලිකාව - මලී දිසානායක

මිනිස් සිරුරේ අඩංගු රසායන මූලද්‍රව්‍ය - දයාරත්න වීරසේකර

සුකොමළ දියවැල (කවි) - රුවන්මලී දීපිකා කොඩිකාර

මුද්‍රණ කලාවේ අති සුන්දර පිටුව (කවි) - නිමල් සේදර

පැයක කතාවක් (පරිවර්තිත කෙටිකතාව) - හෙල්මලී ගුණතිලක

සිංහල හයිකු (කවි) - ජයන්ත මිහිඳුකුලසූරිය

මගේ රත්තරන් පුතාට තිස් තුන් කෝටියක් දෙවි දේවතාවුන්ගේ පිහිටයි
- ප්‍රියන්ත ෆොන්සේකා

කන්ථක නොවන ස්ත්‍රිය (කවි) - ලෝචනී අමරසූරිය

හිරු සැඳෑ සක්මන (කවි) - අමිතා පද්මකුමාරි

හේතු (කෙටිකතාව) - අනුරුද්ධ වැලිගමගේ

යුෂ්මතිය (කවි) - රූපිකා ද සිල්වා

කැලිෆෝනියාවේ දී ය (කවි) - මාලිනී ගනේවත්ත

ඔබට ඇසුන ද ප්‍රියේ (කවි) - නාලනී ද සිල්වා

ඒ ඔබයි (කවි) - අනුරුද්ධ වැලිගමගේ

නොකෙලෙසුනු යුවතිය (කවි) - රංජිත් කිරිඇල්ල

එකම අහසක (කවි) - ඉන්දිකා තිලකුමාර

ප්‍රේමණීය වසන්තය (කවි) - මලී දිසානායක

සැප්තැම්බර් සිසිල ප්‍රහේලිකාවේ විසඳුම

ගැලරිය (කවි) - අසංක ලක්නාත

හුස්ම (කවි) - කළණ දිසානායක

සිසිල පොත් පුවත් - පැහැසරණී කාව්‍ය සංග්‍රහය

බණ්ඩාරනායක සිහි වී (කවි) - ආනන්ද ගුණතිලක

ක්ලාස් එකක කතාවක් - විදූෂක


## සිසිල සකසුගෙන්

මේ “සිසිල” සඟරාව පියවර නගන්නේ අපේ සිව්විවෙනි වසරේ දෙවෙනි මාසයට ය. හුදෙක් සිංහල සාහිත්‍යයේ උන්නතිය සළකා ලේඛකයින්ට තම නිර්මාණ සහ ලේඛන එළිදක්වන්නට මාධ්‍යයක් ලබාදීම මෙන්ම පාඨකයින්ට හරවත් යමක් කියවීමේ අත්දැකීම ලබාදීමත් පිණිස කිසිදු මූල්‍යමය අරමුණකින් තොරව පවත්වාගෙන යන “සිසිල” සඟරාවට අප තබන හැම පියවරක් ම දිනුමකි.

“සිසිල” සඟරාව කියවන්න. ඔබේ සහෘදයින් අතර බෙදා හරින්න. සඟරාවේ පිටපත් කෙළින්ම ලබා ගැනීමට අවශ්‍ය අයට sisila.sangarawa@gmail.com ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් එවන්නැයි දැනුම් දෙන්න.

සඟරාව ගැන පොදුවේ ඔබේ අදහස් ද, සඟරාවේ අන්තර්ගතව ඇති ලිපි සහ නිර්මාණ පිළිබඳ ඔබේ සුවිශේෂී අදහස් ද, ඔබේ ලිපි, කෙටිකතා සහ කාව්‍ය නිර්මාණ ද එම ලිපිනයට ම අප වෙත එවිය හැක.

ඒ ඒ ලේඛකයින්ගේ ලිපි සහ නිර්මාණ පිළිබඳව පාඨක ඔබේ අදහස් ඔවුන්ට කෙළින් ම ඊ-මේල් මගින් දැනුම් දීමට ද හැක.

වෙබ් අඩවිය:
[sisilamagazine.blogspot.com]

ෆේස්බුක් පිටුව:
[www.facebook.com/SisilaMagazine]

ෆේස්බුක් කණ්ඩායම:
[www.facebook.com/groups/sisila]

ස්තුතියි.

**- රසික සූරියආරච්චි,**
**සංස්කාරක, සිසිල මාසික සඟරාව**




# මේ ජනාධිපතිවරණය ම ජයග්‍රහණයක්



ජනාධිපතිවරණයේ අවසන් ප්‍රතිඵලය නිවේදනය කරමින් 2024 සැප්තැම්බර් 22 දින කොළඹ මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ පැවති රැස්වීම අමතමින් ජයග්‍රාහී අපේක්ෂකයා වූ අනුර කුමාර දිසානායක තම කතාව පටන් ගත් මුල් වැකිය මගේ මේ සටහන සඳහා මාතෘකාව ලෙස යොදා ගත්තේ කරුණු කිහිපයක් අවධාරණය කිරීමට ය.

එම ප්‍රකාශය ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන හා සමාජ වාතාවරණයත් මෙවර ජනාධිපතිවරණයත් පිළිබඳ යථාර්තය කැටිකොට දක්වන අරුත්බර ප්‍රකාශයක් ලෙස ය මට පෙනෙන්නේ.

පසුගිය දශක දෙකක පමණ පමණ සිට රට තුළ උත්සන්න වූ සමාජ ආර්ථික හා අධ්‍යාත්මික පරිහාණිය ගැන අමුතුවෙන් කිව යුතු නොවේ. රටේ ඉතිහාසයේ කෙදිනකවත් නොවූ විරූ අයුරෙන් ආර්ථිකය කඩා වැටිණ. මෙයට හේතු වූයේ මොනවාද?

මහජන ඡන්දයෙන් තේරී පත්වූ ඇතැම් නායකයෝ රටේත් ජනතාවගේත් අභිවෘධිය වෙනුවට තම නෑසිය හිත මිතුරන්ගේ අභිවෘධිය පිණිස පමණක් වැඩ කරන්ට පටන් ගත්හ. රාජ්‍ය දේපළ ආරක්ෂා කරනු වෙනුවට ඒවා තමන්ගේ බූදලයක් ලෙස සලකා හිතුමතේට පරිහරණය කරන්ටත්, විදේශ රටවලට විකුණා දමන්ටත් පටන් ගත්හ. නීතියේ ස්වාධීනත්වය විනාශ කර තමාට අභිමත පරිද්දෙන් නීති විරෝධී ක්‍රියාවල නිරතව දේශපාලන බලයෙන් හා සල්ලි බලයෙන් ඒවා යටපත් කරන්නට හා මහජනතාවගෙන් සඟවන්නට කටයුතු කළහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ උත්තරීතරම ආයතනය වූ පාර්ලිමේන්තුවට ඇතුළුවීමට මංකොල්ලකරුවන්ට, ස්ත්‍රී දූෂකයන්ට හා මිනීමැරුම් චෝදනාවලට අධිකරණයෙන් වරදකරුවන් වූ අයට අවස්ථාව උදාවිය. මිනීමරුන් නඩුවලට වරදකරු වී ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නිරත වූ ඇතැමුන්ට ජනාධිපති සමාව ලබාදී රටේ වගකිවයුතු රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් බවට පත් කරනු ලැබී ය. රටේ ආරක්ෂක අංශ ඇතුළු වගකිව යුතු තනතුරුවලට අදාළ විෂය පිළිබඳ කිසිදු අධ්‍යාපනික සුදුසුකමක් හෝ වෘත්තීය අත්දැකීම්වලින් තොර අය ද, ඇතැම්විට අධිකරණය මගින් නඩු පැවරූ පුද්ගලයන් ද පත් කරනු ලැබූහ. මත්ද්‍රව්‍ය උවදුර වසංගතයක් මෙන් රට පුරා පැතිරිණි. තරුණ පරපුර මත් උවදුරෙන් බේරාගැනීම වෙනුවට අපේ ඇතැම් නායකයන් කළේ මත්ද්‍රව්‍ය කන්ටේනර පිටින් රටට ගෙනා දේශපාලකයන් වැළඳගෙන ඔවුනට සුභ පැතීම ය.

සුළුතරයක් වූ අවංක රජයේ සේවකයින්ට තම තනතුරත්, රැකියාවත් ජීවිතයත් බේරාගැනීමේ තර්ජනයට මුහුණ දී හෘදය සාක්ෂියට විරුධව රාජකාරියේ දෙන්ට සිදුවිය. උගතුන් රට හැර යාම ද විශාල ලෙස වාර්තා විය.

මේ සියල්ලේම ඵලවිපාක වුයේ රටේ දරිද්‍රතාවය තව තවත් වැඩිවීම ය. තුන් වේල ආහාර ගැනීමට පුරුදු වී සිටි ජනතාවට, පෙර ලෙස ආහාර ගැනීමත්, දරුවනට පාසල් පොත් මිලදී ගැනීමත් සිහිනයක් ම විය. ජන ජීවිතය අඩාල විය. මේ අර්බුදකාරී තත්වය වෙනස් කිරීමේ අටියෙන් ජනතා ඡන්දයෙන්, 2015 දී හා 2019 දී, තෝරාගත් නායකයෝ මහජනතාවගේ බලාපොරොත්තු සුනු විසුණු කළහ. ඒ දෙවාරයේ දී ම, ඒ නායකයන් කළේ රට තවදුරටත් අගාධයට ඇද දැමීම ය. මේ අර්බුදයට පිළියම් ඉල්ලමින් තරුණ ජනතාව හා රටේ අනාගතය ගැන හද සසල වූ රටවැසියන් ගාලු මුවදොරට එක් රැස් වී අරගලයක නිරත වූහ. එම සාමකාමී අරගලයට පාලක දේශපාලන නායකයන්ගේ අනුදැනුම ඇතිව මැර ප්‍රහාරයක් එල්ල් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රට පුරා මහා දේපල විනාශයක් ද සිදුවිය. ජනාධිපතිවරයා රටින් පළා ගියේ ය. ඔහුගේ හිඩැස පිරවූ අළුත් ජනාධිපතිවරයා කළේ ජනතාව පිට

තවත් බදු බර පටවමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බෙර පදයට අනුව නැටීම ය. ජනතාවගේ ආර්ථික දරිද්‍රතාව තවත් උත්සන්න වුවා මිස සහනයක් පේනතෙක් මානයක නොවී ය.

මෙවැනි අබුද්දස්ස යුගයක මෙවැනි ජනාධිපතිවරණයක් පැවැත්වීමට හැකිවීම පවා විස්මය ජනක ය. මෙතෙක් ශ්‍රී ලංකාවේ පැවති කිසිම මැතිවරණයක නොවූ විරු ආකාරයට ප්‍රචණ්ඩ ක්‍රියා කිසිවක් වාර්තා නොවූ සාමකාමී මැතිවරණයක් පවත්වන්නට හැකිවීම තුළින් පෙන්නුම් කළේ ශ්‍රී ලංකික ඡන්දදායකයන් දේශපාලන වශයෙන් කොතරම් දුරට පරිණත වී ඇති ද යන්න ය.

පොදු මහජනතාව බලාපොරොත්තු වූ වෙනස සිදු කළ හැකි යයි ඔවුන්ගේ විශ්වාසය දිනාගත් ජාතික ජන බලවේගයේ නායකයා දැන් ජනාධිපති ධූරයට පත් වී ඇත. නව ජනාධිපතිවරයා, සුන්බුන් වී ගිය ආර්ථිකය හා ජන සමාජය එක සතියකින්, මාසයකින්, අවුරුද්දකින් වෙනස් කළ හැකි මැජික්කාරයකු නොවන බව දේශපාලන පරිණතභාවයක් ඇති ජනතාව අවබෝධ කර ගත යුතු ය. රටේ බිඳ වැටුණු ආර්ථිකය මෙන් ම, කලක් තිස්සේ මුල් බැසගත ඇති ජනතා ආකල්පය ද වෙනස් විය යුතු ය. දශක කිහිපයක් තිස්සේ දේශපාලකයන්ගේ හෝ ස්වකීය ඉහළ නිලධරයන්ගේ දූෂිත නාස්තිකාර ක්‍රියා කලාපය නිසා හොරකම්, දූෂණය පුරුදු පුහුණු කළ අය එම ආකල්ප වෙනස් කර ගත යුතු ය. එය පටන් ගත හැක්කේ නව ජනාධිපතිවරයා ඇතුළු ඇමති මණ්ඩලයෙන් හා රාජ්‍ය ආයතනවලට අලුතෙන් පත්වන ප්‍රධානීන්ගෙන් ම ය.

“රට බාරගත්තට බලමු කොරන හැටි!” වැනි ආකල්පයක් ඇතැම් විරුධවාදීන් විසින් පතුරුවන බව දැන් දැන් පෙනී යයි. මේ ප්‍රතිවාදී ආකල්පය නව ජනාධිපතිවරයාට හා නව රජයට මුහුණ දිය යුතු අභියෝගයක් මෙන් ම, වෙස්වලාගෙන පැමිණි ආශීර්වාදයක් ලෙස ය මට පෙනෙන්නේ. ඒ අභියෝගයට මුහුණදීමට නම් නව රජය කළ යුත්තේ මීළඟට සැලසුම් කර ඇති මහා මැතිවරණයට පෙර ඇති කෙටි කාලය තුළ දී ජනතා විශ්වාසය රැක ගැනීම සඳහා වැදගත් පියවර කිහිපයක් ගැනීම ය.

මහජන දේපල අයථා ලෙස පරිහරණය කළ අයටත්, විවිධ දේශපාලන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා දහස් ගණන් මිනිස් ජීවිත විනාශ කළ අයටත්, රට ආර්ථික බංකොලොත් භාවයට පත්කළ දේශපාලකයන්ටත් විරුද්ධව නිසි නීතිමය පියවර ගැනීමේ මූලික කටයුතු මහමැතිවරණයට කලින් එළඹෙන මාස කිහිපය තුළ දී ආරම්භ කළොත් නව ජනාධිපතිවරයා හා නව රජය කෙරෙහි ජනතා විශ්වාසය ගොඩනැගිය හැකිය. ජනධිපතිවරයා නියෝජනය කරන දේශපාලන පක්ෂයට මහා මැතිවරණයෙන් විශාල ජන වරමක් ලබා ගත හැක්කේ එවිට ය.

මේ ලැබූ ජනතා ජයග්‍රහණය, 2015 සහ 2019 ජනාධිපතිවරණවලින් පසුව සිදුවූ ආකාරයේ රට අගාධයකට නොයවන, මහජන සුභ සිද්ධිය හා සෞභාග්‍යය උදාකරන ජයග්‍රහණයක් වෙනු ඇතැයි රටට ආදරය කරන ජනතාවගේ අපේක්ෂාව වන්නේ ය.

- **පාලිත ගනේවත්ත** [pganewatta@gmail.com]

# ජයග්‍රහණය



කඳුළු බිඳ වූ මුතු ඇටය දැන් යළිත් ඇස් ඇර බලා වී
දන නුවන නැගි කඳුළු පිසලන දිනය විගසින් ළඟා වී
රටම වැනසූ අමන නයු රැළ බියෙන් තැතිගෙන මුවා වී
රටම පිබිදෙන අලුත් යුගයක හිරු කිරණ ඇත උදා වී

හොර බොරුව නැති සොඳුරු මිනිසෙක් රටේ ජනපති වූ වගයි
දුකින් පීඩිත දිළිඳු ජන මුව සිනා කැන් පැතුරුණු වගයි
යුව දනන්ගේ අරගලය මල්ඵල දරා පිබිදෙන වගයි
රටක් හොළවන මහ පෙරළියක පෙර නිමිති දිස්වෙන වගයි

- **පාලිත ගනේවත්ත** [pganewatta@gmail.com]

සිසිල සඟරාවේ පළ වී ඇති ලිපිවල බුද්ධිමය අයිතිය මෙන්ම සහ ඒවායේ අන්තර්ගතතය පිළිබඳ වගකීම ද ඒ ඒ ලේඛකයා සතුවේ. මෙහි පළ වී ඇති ලිපිවලින් සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ අදහස් නිරූපණය නොවෙන බව කරුණාවෙන් සලකන්න.

# සිසිල කෙටිකතාව

# උදුම්බරා

**ඉන්දිකා තිලකුමාර**



සම්මුඛ පරීක්ෂණය සඳහා මට ලැබී තිබුණ වෙලාව හවස හතර. ඒ සඳහා ම මිලට ගත් ලා දුඹුරු පැහැති කලිසමත්, ඊට ම ගැලපෙන කමිසයත් හැඳගෙන මා වාඩි වී සිටියේ පොරොත්තු ශාලාවේ මුල් ම පේළියේ අසුනකයි. නවීන ගෘහනිර්මාණ ශිල්පක්‍රම භාවිතා කරමින් යාවත්කාලීන කර තිබූ ශාලාවේ මට ඉදිරියේ තිබූ ලොකු දර්පනයෙන් මට මගේ රුව බොහොම කඩවසම් විදිහට පෙනුණා. ඉදිරියේ ඇති දර්පනයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගෙන ටයි පටියේ ගැටය තදකරගත් මා තවදුරටත් අඩුපාඩු සකස්කරගත්තේ පුංචි හෝ වැරැද්දක් නොවෙන්නටයි. අනතුරුව මගේ ලිපි ලේඛන සහිත පයිල් කවරයත් අතැතිව මගේ නම අඬ ගසන තුරු මා බලා ගෙන සිටියේ තරමක නොඉවසිල්ලෙන්.

මේ අලුත් රැකියාව ගැන මගේ හිතේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. ඕස්ට්‍රේලියාවේ දී ලබාගත් ආචාර්ය උපාධියෙන් පසු මේ මා සම්මුඛ පරීක්ෂණයකට සහභාගිවන පළමු වතාව. ඕස්ට්‍රේලියාවට යාමට පෙර, විශ්වවිද්‍යාලයේ අවසාන වසරේ දී පුහුණුවට ගිය ආයතනයේ ම, පසුව වසරක පමණ කාලයක් සේවය කළාට, මගේ අවුරුදු තිස් තුනක ජීවිත කාලයට ම, මම මගේ විෂයට ගැලපෙන රැකියාවක් පිළිවෙළකට කරලා තිබුණෙ නැහැ. සුප්‍රසිද්ධ ඩී හයිඩ්‍රෝ සමාගම ජල විදුලිබලාගාර හා සම්බන්ධ වුවක්. ඔවුනගේ ජාලය ශ්‍රී ලංකාව තුළත් ඉන් පිටත කෙන්යාව, උගන්ඩාව වැනි අප්‍රිකානු රටවලටත් විහිදී තිබුණා. මා අසා ඇති පරිදි මුළු සමාගමට ම සිටියේ කාන්තාවන් දෙදෙනායි. අධ්‍යක්ෂවරිය සහ ඇගේ පුද්ගලික සහායිකාව පමණයි. මේ සමාගම කාන්තාවන් වැඩට නොගන්නා සමාගමක් ලෙස ප්‍රසිද්ධව තිබුණා.

මට පෙර සම්මුඛ පරීක්ෂණය හමාර කළ කිහිප දෙනෙකු පොරොත්තු ශාලාවේ රැඳෙමින් එකිනෙකා හා කතා බහ කරමින් පිටත යාමට සැරසෙමින් සිටිනු මගේ නෙත ගැටුණා. ඔවුන් දුටු විට මගේ බලාපොරොත්තු දැල්වෙන්නට පටන් ගත්තේ ඔවුන් හා සසඳා බලද්දී තනතුරට ගැලපෙන පෞරුෂයක් ද මා සතු බව ඒ වන විටත් මට වැටහී තිබුණ නිසයි.

“මිස්ටර් විදුර අබේසිංහ?” කාර්යාල කාර්ය සහායකගේ උස් හඬ ඒ සමඟම මට ඇසුණා.

ඔහු විවර කළ දොරෙන් ඇතුළු වුන මා සභාපතිගේ කාමරය යැයි අනුමාන කළ හැකි ස්ථානයකට කැඳවා ගෙන යනු ලැබුවා. පරීක්ෂක මඬුල්ල අසුන්ගෙන හිටියේ සම්මන්ත්‍රණ සඳහා භාවිතා කරන ආකාරයේ දිගු කාර්යාල මේසයක යි. මුල් පුටුවේ අසුන්ගෙන සිටියේ යුරෝපීය ඇඳුමින් සැරසුන වයස අවුරුදු හතළිස් පහක් පමණ වූ සමාගමේ සභාපති වරයායි. අන්තර්ජාලයෙන් ලබාගත් තොරතුරුවලට අනුව ඒ දේවින්ද රණබාහු බව මම දැන ගත්තා. ඔහුගේ දකුණු පසින් අධ්‍යක්ෂවරිය අසුන්ගෙන සිටියා. සමාගමේ වෙබ් අඩවියේ ඇගේ නම සඳහන් වී තිබුණේ ඒ ඒ යු පී කේ ඇල්ලේපොල මෙනවිය යනුවෙන්.

ඇය සභාපතිට වඩා ලාබාල බව පෙනුණා. නවීන මෝස්තරයට එහෙන් මෙහෙන් ලාවට වර්ණ ගැන්වූ කෙටි කෙස් කළඹක් ඇයට තිබුණා. කළු පාට අත් නැති හැට්ටයට, ඇගේ රන්වන් අත් ගොබ ලස්සනට කැපිලා පෙනුණා. කළු-සුදු ජ්‍යාමිතික හැඩතල සහිත සාරිය අවස්ථාවට ගැලපෙන වෘත්තීය පෙනුමක් ඇයට ලබා දුන්නා. ත්‍රිකෝණාකාර හැඩැති කරාබු යුවල හැරුණු කොට ඇය කිසිම ආභාරණයක් පැළඳ සිටියේ නෑ. ලා රෝස පාට ආලේපනයක් ගැල්වූ ඇගේ පිරුණු තොල් දෙපට නා දල්ලක ස්වභාවී හැඩ තලයක් ගත්තා. සිනාසෙන විට වම් කම්මුල වල ගැසුණේ අමුතුම චමත්කාරයක් දනවමින්.

සාමාන්‍යයෙන් මෙවැනි තැනක දී බලාපොරොත්තු විය හැකි තොරොම්බල් කරත්තයක් වෙනුවට උසස් රසඥතාවක් ඇති අයෙකු හා මා ගණුදෙනු කරනා බව පළමු බැල්මෙන්ම මට අවබෝධ වුණා.

ඇය මට අතින් සන් කරමින් ඇය ඉදිරියේ වූ පුටුව පෙන්වා හිටියා.

"ස්තූතියි! සුබ සන්ධ්‍යාවක් මැඩම්! සුබ සන්ධ්‍යාවක් සර්!"

"ආචාර්ය විදුර අබේසිංහ. එතකොට ආචාර්ය උපාධිය කළේ කොහෙද?"

"ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයේ මැඩම්," මං උත්තර දුන්නා.

"එතකොට ආපහු ලංකාවට එන්න හිතුවෙ ඇයි ?" හිස ඇල කරලා ඇය ඇහුවා.

"මං ලංකාවට ගොඩාක් කැමතියි මැඩම්, ඒකයි," මං කිව්වා.

"මීට කලින් ජලවිදුලි බලාගාර ආශ්‍රිත මොනවා හරි පුහුණුවක් තියෙනවා ද?"දේවින්ද රණබාහු මගෙන් ඇහුවා.

"ඔව් සර්, මම අවුරුද්දක් විතර කොත්මලේ ඉඳලා තියෙනවා."

"ඒක හොඳයි. යමුකො පොඩ්ඩක් එළියට මට ඔයාට පෙන්නන්න දෙයක් තියෙනවා," රණබාහු එළියේ පොරොත්තු ශාලාවට මා කැඳවා ගෙන ගියා.

එතැන තිබුණා ජලවිදුලි බලාගාරයක පුංචි ආකෘතියක්.

මිනිහා මාව ප්‍රශ්න කළ ආකාරයෙන්ම මේ ඉන්නේ නිකම්ම නිකම් සභාපති කෙනෙක් නෙමෙයි කියලා මට ඉක්මනින්ම තේරුණා. ඇහුවේම ප්‍රායෝගික ප්‍රශ්න. කොත්මලේ බලාගාරයේ වැඩ කරලා තිබුණු පළපුරුද්ද, මගේ ආචාර්ය උපාධියටත් වඩා මට උදව් වුණා කියලා මට හිතුණා.

ආපහු කාමරයට ඇතුළු වෙලා නැවත ඉඳගන්න කොට රස්සාව හරි යයි කියලා මට සෑහෙන විශ්වාසයක් තිබුණා.

"අපි මේ තනතුරට දෙන්නෙක් බඳවා ගන්නවා. එක තනතුරක් ලංකාවේ. අනික අපේ අප්‍රිකානු ජාලයට. ලංකාවේ අපේ බලාගාර ලංකාව පුරාම වගේ තියෙනවා. ඒ තනතුරට තෝරාගන්න කෙනාට ඒ බලාගාර කොයි එකත් වගේ ආවරණය කරන්න වෙනවා."

"තෝරා ගත්තොත් අබේසිංහ මහත්තයාට පුළුවන් ද? ඒ වගේම කැමතිද, ඒ විදිහට ලංකාවෙ හරි නැතිනම් අප්‍රිකාවට හරි යන්න?" දේවින්ද රණබාහු මගෙන් ඇහුවා.

"ගැටළුවක් නෑ සර්, ලංකාව ඇතුළේ ඒ වගේ කොතැන වුනත්. කොළඹින් පිට ඉන්න මං කොහොමත් කැමතියි. ටික කාලයකට නම් අප්‍රිකාව වුනත් ප්‍රශ්නයක් නෑ සර්. මම හරි ආසයි පින්තූර ගන්න. අප්‍රිකානු රටවලට මං පුද්ගලිකව හරි කැමතියි," මං කිව්වා.

"එතකොට අබේසිංහ මහත්තයා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ද මූලික උපාධිය ලබා ගත්තේ?" අධ්‍යක්ෂවරිය මගෙන් ඇහුවා.

"ඔව් මැඩම්!"

"ඔබේ රැකියා අයැදුම්පතේ ඔබ ගැන රෙකමදාරු ලබා ගැනීමට මහාචාර්ය ඇල්ලෙපොල නම් කර තියෙනවා. මහාචාර්ය ඇල්ලෙපොලව පෞද්ගලිකව දන්නවා ද?" ඇය ඇහුවේ මුහුණේ ඇඳී ගිය අමුතු සරදම් සිනාවක් සමග කියා මට මොහොතකට හිතුණා. ඒත් ඒ ඇයි කියලා මට එවෙලේ හිතාගන්න බැරිවුණා.

"අපොයි ඔව් මැඩම්. සර් මට තාත්තා කෙනෙක් වගේ."

"එහෙමද...?" එවර ඇය ඇදලා පැදලා කිව්වා. රණබාහුත් ඇගේ සිනාවට එකතු වුනා ද? ඒ මට පෙනිච්ච හැටිද මන්දා?

"තාත්තා කෙනෙක් වගේ නම් ඒ ගෙදර ගිහිල්ලා නැතෑ. පවුලේ අයව එහෙම අඳුරනවා ඇති."

"ඔව් මැඩම්. සර් මාර්ස් හිල් එක ළඟ ක්වාටස් එකේ ඉන්න කොට මම නිතර එහේ යනවා. මං සර්ගේ දුවටයි, පුතාටයි උසස් පෙළ ටියුෂන් දුන්නා. මැඩම් සර්ව දන්නවා ද?"

මට දැන් විශ්වාසයි මේ වැඩේ හරි යනවා. ඇල්ලෙපොල සර්ගෙන් ඇහුවොත් ඉතින් ආයෙ දෙකක් නෑ ඉහළම රෙකමදාරුවක් තමයි. මගේ හිත සතුටින් පිම්බුණා.

"මොකෝ ඉතින් මැඩම් නොදන්නේ තමුන්ගේ අප්පච්චිව?" රණබාහු ඔලොක්කුවට හිනාවෙලා මැද්දට පැන්නේ ඇගේ අයිතිකාරයා ගානට.

"දෙයියනේ අර කැහැටු කෙල්ල ද මේ?" මට පුදුම හිතුණා.

ලෑල්ලක් වගේ පැතැලි පපුව, කෝටු දෙකක් වගේ හීනි දිග කකුල් මට මතක් වුණා.

ඒ මදිවට හැමදාම හවසට ඉස්කෝලෙන් පස්සෙ නෙට්බෝල් හරි, බාස්කට් බෝල් හරි ගහලා දාඩිය පෙරාගෙන, කෝටු කකුල් පේන්න කොට කලිසමකුයි මොකක් හරි ටී ෂර්ට් කෑල්ලකුයි එල්ල ගෙන, වදෙන් පොරෙන් මගෙ භෞතික විද්‍යාව පන්තියට එකතු වෙන කෙල්ල!

හිනාවෙන කොට දත් ටිකේ කටු කම්බි වැටක් වාගේ කැලි බෑලි අලවගෙන. දෙයියනේ මේ ඇය ම ද?

"අනේ! විදුරයියා, මේකෙ උත්තරේ එන්නෙ නෑ නේ!" ඒ දවස්වල මාව තරහ ගස්සවන බොරු හුරතලේ!

කොල්ලන්ගෙ උසුළු විසුළු!

"එන පොට හරි නෑ මචෝ! ඇල්ලයා දූ කුමාරි උඹේ ඇගේ ගහන්න වගේ යන්නේ."

"අනේ පල ඩෝ යන්න. ඒකි මේ රටේ ඉන්න අන්තිම කෙල්ල වුනත් මට නම් එපා. බලපන් ඇගේ මස් කළඳක් නෑ."

"ඒ වගේද බං? උඹට ක්ලාස් එකක් ෂුවර්," කොල්ලන්ගේ හැකර කතා මට සිහියට නැගුණා.

මෙය විය හැක්කක්ද? මේ තරුණිය ඒ කැහැටු කෙල්ලට වඩා කෙතරම් රූමත් ද?

ඇය පොතක් අස්සට දාලා දුන්න වැලන්ටයින් කාඩ්පත, හේතුවක් නැතිව එවපු අතෝරක් නැති කෙටි පණිවිඩ මගේ මතකයට ආවා.

ඒ දවස්වල මට වහ වැටිලා හිටිය කැහැටු කෙල්ලට මං දාපු සයිස් එක මතක් වෙලා මට හීන්දාඩිය දැම්මා.

“හරි දූමී, ඔයා එහෙම නම් අප්පච්චිගෙන් පොඩි ලියුම් කැල්ලක් ගෙන්න ගන්නකෝ පයිල් එකට,” රණබාහුවා කිව්වා.

දූමී! ඒක මාර නම් කොට කිරිල්ලක්නේ. මට නම් මතක විදිහට ඇය උදුම්බරා. ඇල්ලෙපොල කැල්ලත් එකතු වුණාම ඒක හරි ගාම්භීර නමක්.

දෙන්නගේ මොනවා හරි පලහිලව්වක් ඇති, මට හිතුණා.

නාකියා කෙල්ල දිහා බලන හැටි! හරියට උගේ කම්පැනියෙම කැල්ලක් දිහා බලනවා වගේ. මගේ හිතේ පුංචි ඉරිසියාවක් මෝදු වුණා.

“හරි විදුර අපි එහෙම නම් දන්වල එවන්නම්! ඔයාට දැන ගන්න මොනවා හරි තියෙනවද?”

“නෑ සර්, එහෙම විශේෂ යමක් නෑ!”

මං එහෙම කිව්වට මට දැනගන්න දෙයක් තිබුණා. හොම්බට හැටක් ඇනලා හරි මට අහන්න හිතුණේ උදුම්බරා උඹේ කවුද කියලයි.

“පස්සේ හම්බු වෙමු එහෙම නම්” මට අතට අත දීලා සභාපති පුටුවෙන් නැගිට්ටා.

* * *

“මහන්සිද? උදේ ඉඳලම එක දිගටම වැඩ නේ. අපි තේ එකක් බීලා ඉමු. අජිත් අපට තේ ලෑස්ති කරන්න,” දේවින්ද රණබාහු තමන්ගේ ගෝලයාට කිව්වා.

ඔහු කාමරය ඇතුළේ පොඩ්ඩක් එහාට මෙහාට ඇවිදලා උදුම්බරා ඇල්ලෙපොල පිටුපස්සෙන් හිටගෙන මේසෙට අත් දෙක තියා ගත්තෙ ඇයට හෙල්ලෙන්නවත් බැරි තාලෙට.

“මොකද ඒ වෙලේ හිනා ගියේ කියන්න,” ඔහු ඇගේ කන් පෙත්තට ඉක්මන් හාදුවක් තවරමින් කනට කෙඳිරුවා.

“හිනා යන්නැද්ද අනේ! ඒ කාලේ මගේ ක්‍රෂ් එක. එයා හරි දක්ෂයි ඒ දවස්වල. අප්පච්චිත් හරි ආදරෙයි.”

“ඌ ඒක දැනගෙන හිටිය ද?” රණබාහුට ඒක දැනගන්න කම් ඉවසිල්ලක් නෑ.

උදුම්බරා ඒකට එක පාරම උත්තරයක් දුන්නෙ නෑ. ඇගේ හිත මොහොතකට අප්පච්චිගේ නිල නිවසේ බරාඳයේ තිබූ රවුම් මේසේ ළඟ නතර වුණා. වෙලාවකට ගණිත් හැදිල්ල පැත්තක තියලා විදුරගේ මූණ දිහා බලාගෙන හිටි හැටි ඇයට මතක්වුණා.

“ඉතින් මොකද වුණේ? “ රණබාහුගේ ප්‍රශ්නයෙන් ඇයගේ සිත නැවතත් වර්තමානයට ආවා.

“මොනා වෙන්නද? එයා මං දිහා බැලුවෙවත් නෑ ඒ කාලේ.”

“බොරු! ඇයි ඇස් පොට්ටද උගේ? මොනා හරි තියෙන්න ඇති ඔය කිව්වට. මං දැක්කනේ බලං හිටිය හැටි හුස්ම ගන්නත් අමතක වෙලා වගේ,” ඔහුගේ දෙතොල් කන් පෙත්තෙන් පල්ලෙහා ඇගේ නිරාවරණ ගෙල පෙදෙසට හිමිහිට ගමන් කළා.

“නිකං ඉන්නකෝ! දැන් අජිත් එයි තේ අරන්,” ඇය එහෙම කිව්වට ඇයටත් අයින් වෙන්න ලොකු වුවමනාවක් තිබ්බෙ නෑ.

“මාව අඳුර ගත්තේ වත් නෑ. ඒ ගමන කියනවා බලන් හිටිය ලු.”

“පිස්සුද අනේ?” අනතුරුව ඇය හිමිහිට කිව්වා.

“ගණිත් හදන කොට අතින් ඇල්ලුවෙ නැද්ද මෙහෙම?” රණබාහු සෙමින් ඇගේ ඇඟිලි තුඩු මිරිකමින් ඇහුවා.

“හැමෝම ඔයා වගේ කියලද හිතේ? ඇක්කා! එයා මං දිහා නරක විදිහට බලලාවත් නැහැ.”

“වෙලාවකට මට සැලකුවේ මං එයාගේ ගුරුවරිය ගානට. අප්පච්චිට තිබුණ සැලකිල්ලටද මන්දා.”

“අප්පච්චිත් එයාට හරි කැමත්තෙන් හිටියේ. කට පුරාම පුතා කියලා තමයි කිව්වේ. වෙලාවකට මල්ලිටත් කේන්ති යනවා අප්පච්චිට එයාටත් වඩා විදුරව විශ්වාසයි කියලා.”

“හැබැයි, මං ගොන් වැඩක් කළා. මගේ ගණිත් හදපු පොත අස්සෙ දාලා වැලන්ටයින් කාඩ් එකක් දුන්නා. මිනිහා ඒක දැක්කෙ නෑ වගේ මට ආපහු දීලා ලිස්සලා ගියා,” ඇය සිනාසෙමින් කීවා.

“ඒ කාලේ තේරුමක් නෑ. කොල්ලෙකුට කියලා දැක්කෙත් විදුර විතරම ද කොහෙද? පව් මෑන්ට බය හිතෙන්න ඇති. අප්පච්චිත් කෙළින් කීවෙ නැනේ ඉතින් කැමතියි කියලා ඇගෙව්වා මිසක්.”

“ඒ වුණාට ඉතින් විදුර කැමති වුණා නම් පැනලා දෙයි නේ? මං අරිනවා ඕකව අප්‍රිකාවට,” රණබාහු කිව්වෙ තරහෙන්.

“දේවී...! දැන් නවත්තන්න ඕක. ඔයා හරියට පොඩි ළමයෙක් වගේ වෙලාවකට... අන්න අජිත් තේ ගේනවා.”

“මගේ තේ එක හදන්න එහෙනම් හොඳ ළමයා වගේ.”

“අද ගොඩාක් මහන්සි වුන නිසා වෙනසකට වගේ අපි එළියට යමු. මේ...” ඔහු ලාච්චුව ඇරලා ටිකට් දෙකක් පෙන්නුවා.

"හයට ටවර් එකේ. මෙතනින් පහට පහයි කාලට වගේ ගියත් මදෑ!"

"මං ගෙදරට කිව්වෙත් නෑ. එහෙම කොහොමද එක පාරට?"

"ඒව සේරම හරි අප්පච්චිගෙනුයි, අම්මගෙනුයි අවසර ගත්තා දූ කුමාරිව එළියට එක්ක යන්න. අප්පච්චි අද පේරාදෙණියෙ කිව්වා. මං අම්මට කිව්වා ඔක්කොටම මම රෑ කෑම ගේනවා කියලා."

"කාර් එක මෙහෙ දාලා මා එක්ක යමු. මං ගෙදරට ගිහින් බස්සවන්නම් ෂෝ එක ඉවර වෙලා. උදේට අජිත් එවන්නම් ගෙදරට ඔයාව ගන්න. හරි නේ."

"සාරිය ඇඳන් යන්න බැරි නම් ඇඳුම් මාරු කර ගන්න. බලන්න මේකට ආසයිද කියලා." ඔහු ඇය අත පාර්සලයක් තබමින් කිව්වා. ඔන්න විනාඩි දහයයි දෙන්නෙ ලෑස්ති වෙන්න."

වෙනදා වගේම ඔහු හැමදේම සැලසුම් කරලා ඉවරයි.

ඇය සාරිය ගලවලා පැත්තකට තියලා ඔහු ගෙනාපු සැහැල්ලු කලිසමත්, කෙටි හැට්ටයත් ඇඳ ගත්තා.

ඇය කැමති විදිහ වගේම, ඇයට ගැළපෙන ඇඳුම් තෝරන්න ඔහුට හොඳ හැකියාවක් තිබුණා.

ඇය සැරසී එනවිට රණබාහුත් සැහැල්ලු ටී ෂර්ට් එකකට මාරු වෙලා හිටියා.

"එහෙනම් යමු," ඔහු ඉස්සර වුණා.

"සර් කැබ් එක ද කාර් එක ද ගන්නේ?" අජිත් ඇහුවා.

"මැඩම් යන නිසා කාර් එකේ යමු. මං ඩ්‍රයිව් කරන්නම්. ඔයා නිමල් එක්ක කැබ් එකේ ඇවිත් එතන දී කාර් එක ගන්න. මං ඉවර වෙලා කතා කරන්නම්."

රණබාහු වාහන අංගනයෙන් තමන්ගේ වාහනය එළියට ගත්තා.

"මට අහන්නත් බැරි වුණා.මොකක්ද නාට්‍යය?" උදුම්බරා රණබාහුගෙන් ඇහුවා.

බස් නැවතුමේ විදුර ඉන්නවා ඒ සමගම උදුම්බරාට පෙනුණා.

"සිරි කාලකණ්ණි නොහොත් උදුම්බරා" රණබාහු පැති කණ්ණාඩියෙන් විදුර දිහා බලමින් හයියෙන් හිනාවුණා. "මේක මේ මනමේ, සිංහබාහු වගේ නාඩගම් ශෛලියට කරපු එකක්. අලුත් කොල්ලෙකුගේ වැඩක්!" ඔහු වාහනය ඉස්සරහට පදවන ගමන් කිව්වා.

"මං ටිකට් ගත්තේ අද මට පිංගුත්තරව හම්බුවෙන බව දැන ගෙන නෙමෙයි. ඔයා ආසා වෙයි කියලා හිතුවා," ඔහු කිව්වෙ ඇත්තට ම.

"පිංගුත්තරත් හිටියේ බස් එකට. දැක්ක ද? ඔන්නම් ඉතින් දාගෙන යමු."ඊලඟට ඔහු සමච්චලේට කිව්වා.

"ඔයා හරි නරකයි දේවි! ඔහොම හිනාවෙන්න එපා මිනිස්සුන්ට, පව්!" උදුම්බරාට ඇත්තටම "විදුර පව්!" කියලා හිතුණා.

"තවත් ඉතින් අනුකම්පාව. හරි! විදුරව කෙන්යා යවමු. අර කෑගල්ලේ කෙට්ටු හාදයට මෙහේ වැඩ ටික බාර දෙමු."

"ඔයා හෙට එහෙම නම් ලියුම් ටික ලෑස්ති කරවගන්න," ඔහු වැඩිදුරටත් කිව්වා.

උදුම්බරාව ඉස්සරහ අසුනේ තියාගෙන ඉදිරියට ඇදුන රණබාහුගේ කළු පාට බී. එම්. ඩබ්ලිව් රථය දැක්කහම සම්මුඛ පරීක්ෂණයේ අන්තිම හරියෙ දි ඉරි තැලිච්ච විදුරගේ හිත හරි මැද්දෙන් දෙකට කැඩුණා.


"අපරාදේ මං එදා අකමැති වුණේ!"

"දැන් ඉතින් සභාපතියා එක්ක හුරතල් වෙවී ඉන්නවා උදේ හවස බල බලා ඉන්නවට වඩා හොඳයි අප්‍රිකාවට ම යනවා. ඔව් අප්‍රිකාවෙ තනතුර දුන්නොත් භාර ගන්නවා, නැත්නම් වෙන මොනවා හරි බලනවා!" විදුර තමන්ටම කියා ගත්තා.

- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

උම්මග්ග ජාතකයේ සිරි කාලකණ්ණි ප්‍රශ්නය ඇසුරින් රචිත ය.

# තනිය



මගේ කවි තව
ඔතන ඔහොම ඇති
කව්රුවත් දුටුවා ද මන්දා


හැඟුම් කැටි කළ
අකුරු අතරේ
මාව දුටුවේ නැද්ද මන්දා

රතු ම රතු පැහැ
රෝස පොකුරක්
පිපී හිනැහී ළඟට ආ දා

පිච්ච පඳුරේ
පිපුණු තනි මල
කව්රුවත් දුටුවා ද මන්දා



- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]




# මා ඡන්දයදීමට අපේක්ෂකයින් තෝරාගන්නේ මෙහෙමයි!



ජනාධිපති ඡන්දයෙන් වැඩි කලක් ගතවෙන්නට පෙර තව සති කිහිපයකින් නොවැම්බරයේ දී ලංකාවේ පාර්ලිමේන්තුවට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට මහජන නියෝජිතයින් තෝරා ගන්නට මහ ඡන්දයක් පැවැත්වීමට නියමිතය.

එදා සිට අද දක්වාම, ලංකාවේ දී ද, ඕස්ට්‍රේලියාවේ ද මා ඡන්දය භාවිතා කිරීමේ දී අනුගමනය කරන නිර්ණායක කිහිපයක් ඇත. මේ නිර්ණායක අනුගමනය කිරීමෙන් වැඩක් මිස අවැඩක් නොවෙන බව අත්දැකීමෙන් ම දන්නා නිසා, ඒවා අනුගමනය කරන මෙන් ඔබෙන් ඉල්ලමි.

- අපව නිවැරදිව ප්‍රජාතන්ත්‍රවාදීව නියෝජනය කළ හැක්කේ අප හා සමාන අයට පමණි. එනිසා ඔබ ඡන්දය/මනාපය දිය යුත්තේ ඔබට ඔවුන්ගේ නමින් ඇමතිය හැකි, එසේ නොමැති නම් සහෝදරයා හෝ සහෝදරිය හෝ කියා ඇමතිය හැකි අයකුට පමණි.
- ඔබෙන් ඡන්දය ඉල්ලන පුද්ගලයාට ඡන්දයට පෙර සහ නැතිනම් පසුව ඔබ ඇමතිය යුත්තේ මහත්තයා, නෝනා, මැතිතුමා හෝ මැතිතුමිය කියානම් ඔවුන්ට ඔබව නියෝජනය කළ නොහැක. ඔවුන් පාර්ලිමේන්තුවේ දී නියෝජනය කරනු ඇත්තේ ඔවුන් හා සමාන පිරිසකි. එනිසා එවැන්නන්ට ඔබේ ඡන්දය/මනාපය නොදෙන්න.
- යම්කිසි ඡන්ද අපේක්ෂකයෙකු රට, ජාතිය, ආගම, මව්බිම, දේශප්‍රේමය, මාතෘ භූමිය වැනි වචන නිරතුරුවම භාවිතා කරයි නම් එවන්නන්ට ඔබේ ඡන්දය මනාපය/දෙන්න එපා. ඉතිහාසය පුරාම අපේ අත්දැකීම නම් එවැනි පුද්ගලයින් අතිශය ජාතිවාදී අවස්ථාවාදීන් බවයි. දෙපිටකාට්ටුවන් බවයි.
- අපේක්ෂක ලැයිස්තුවල සිටින කාන්තාවකට ඔබ ඡන්දය/මනාපය දීමට බලාපොරොත්තු වන්නේ නම්, කාන්තා අයිතිවාසිකම් ගැන හඬ නගන අයකුට පමණක් ඡන්දය දෙන්න. එසේ නොමැතිව, "අනේ අපි කාන්තාවන් ලෙස අපිට හිමි තැන දන්නවා, අපිට උඩ මළුවට, පත්තිරිප්පුවට යන්න ඕනෑ නැහැ" වැනි පසුගාමී ප්‍රකාශ කර ඇති අයට ඔබේ මනාපය ඡන්දය දෙන්න එපා.
- එසේම, අප වසන සමාජයේ ම කොටසක් වන සම-රිසි ලිංගිකත්වයක් ඇති (සමලිංගික/හෝමෝසෙක්ෂුවල්) පිරිසට අපහාස කරන හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළි නොගන්නා හෝ කිසිදු අපේක්ෂකයෙකුට ඔබේ ඡන්දය මනාපය දෙන්න එපා.
- අමුතුවෙන් කීම අනවශ්‍ය වුවත්, හොරකම්, දූෂණ, වංචා, මැරකම්, නීතිවිරෝධී කටයුතු කිසිවකට සුළු හෝ සම්බන්ධයක් ඇති කිසිදු අයෙකුට ඔබේ ඡන්දය/ මනාපය දෙන්න එපා.

- **රසික සූරියආරච්චි**

[rasika.suriyaarachchi@gmail.com]

The intellectual property of the articles published in Sisila magazine remains with the respective writers. Writers are also responsible for the content of the articles published under their names.

Please note that articles published in Sisila do not represent the views of the Writers Guild of Sinhalese Cultural Forum of NSW Inc.

# මාල පබලු වැල් කරවටලන්නට

පද රචනය: කිංග්ස්ලි දිසානායක
සංගීතය: ප්‍රේමසිරි කේමදාස
ගායනය: අමරදේව සහ නන්දා මාලනී



තරුණිය:
මාල පබලු වැල් කරවටලන්නට
තෝඩු අරුංගල්
තෑගි ගෙනෙන්නට
දවසක් ඒවි ලු බිනර මහේ,
බිනර මහේ

තරුණයා:
කෝල කොමල ඉඟි මුවින් සිනාසී
හීන් හඬින් කොඳුරමින් එදා කී
හිරිමල් සීපද තාම ඇසේ,
තාම ඇසේ

“මාල පබලු වැල් කරවටලන්නට” යනු සංකේතාත්මක, මනරම් කාව්‍යෝක්තියකි. එතුළින් ධ්වනිතවන්නේ මේ පෙම් යුවළ අතිනත් ගන්නා දිනය පිළිබඳ ඔවුන් දෙදෙනා අතර සිදුවන ප්‍රේමණීය සංවාදයකි. “තෝඩු අරුංගල් තෑගි ගෙනෙන්නට” යන්නද එවැනි ම රසවත් කාව්‍යෝක්තියකි. එයින් ධ්වනිත වන්නේ මනමාලයා විසින් මංගල දිනයේ දී මනාලියට රැගෙන ආ යුතු කනකර අබරණ වේ. බිනර මහ ඒ මංගල මාසයයි.

“නව යොවුන් වියේ දී ලැජ්ජාවෙන්, කොමළ ඉඟි බිඟි පාන මුහුණින් යුතු ව කොඳුරා කී සීපද තවමත් මගේ සවනට ඇසෙනවා වගේ දැනේ” යයි ප්‍රේමාන්විත ව පෙම්වතා රසාලිප්ත අතීතය සිහිපත් කරයි. අතීතයේ මේ දෙදෙනා ප්‍රථමයෙන් හමු වී ඇත්තේ ඇය සීපද ගයමින් සිටි අවස්ථාවක බැව් අපට හැඟෙයි.

“මාල පබලුවැල්”, “තෝඩු අරුංගල්”, “බිනර මස”, “සී පද”, “හිරිමල්” යන ව්‍යංගාර්ථවත් පද රටා තුළින් මේ පෙම්වතුන් ගේ සුන්දර හැඟීම් සේ ම, වැදගත් ජීවන තොරතුරු ද ධ්වනිත වේ.

පිටිසර ගම්වල වැසියෝ බහුතරයක් යැපුම් මට්ටමේ සුළු ආදායමක් ලබන ගොවියෝ වෙති. අවශ්‍යතාව ඇතත්, මංගල දිනයේ දී වුව රත්තරන් ආභරණ සඳහා අධික වියහියදම් දැරීමට තරම් ඔවුන්ගේ අත මිට සරු නැත. එසේම, පිටිසර ගැමි සමාජය චාම්, සරල ජීවන ආකල්පවලින් යුක්ත ය. උගත් මධ්‍යම පන්තියකින් යුක්ත, නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජන සමාජය මංගල අවස්ථාවේ දී මනාලිය රන්මුවා අබරණ නොපැළඳීම සාමාජීය වශයෙන් අගෞරවයක්ය යන ආකල්පයෙන් යුක්ත වේ. ඔව්හු ඒ නිසා ගිනි පොලියට මුදල් ණයට ගෙන හෝ රන්මුවා කනකර ආභරණ මිල දී ගනිති. ඒ ආභරණ "මාල පබළු වැල්" නොව "රන් මුතු මැණික් අභරණ" වේ. එනිසා "මාල පබළු වැල්" කාව්‍යෝක්තියෙන් ධ්වනිත වන්නේ මේ පෙම්වතුන් පිටිසර ගැමි සමාජයට අයත්, චාම් සරල ජීවිතයක් ගත කරන අහිංසක ගැමියන් බවය.

පෙම්වතා:
ගිරා කොබෙයියෝ රංචු ගැහී
වැව් ඉස්මත්තේ

පෙම්වතිය:
ආල කතන්දර රහස් කියනව ලු,
උන් උන් අපි ගැන කතා කරනවලු,
ළං ළං වී ලා

“අර බලන්න කෝ. වැවට උඩහින් ගිරා කොබෙයියන් රංචු රංචු ගැසී සිටින අයුරු කොපමණ ලස්සනද?” පෙම්වතා අසයි.

“ඒ කුරුල්ලන් එකිනෙකාට ළංවී, රංචු ගැහී අප දෙදෙනා ගැන කතාකරනව ලු, එකිනෙකාට ළංවී අපගේ ආල කතන්දර රහස් කතාකරනව ලු” පෙම්වතිය සතුටින් කියන්නීය. “කුරුල්ලන් පවා අපි දෙන්න ගේ ආදරය දැකලා හරියට සතුටු වෙනවා” ඇය පවසන්නී ය.

පෙම්වතුන් දෙදෙනාගේ ප්‍රේමණීය, සුන්දර හමුවීම මුළු පරිසරය අලංකාර වීමට හේතු වූ බැව් එයින් ධ්වනිත වේ.

පෙම්වතා:
හීන ඉසව්වේ පෙරුම් පුරා
එන හීනේ

පෙම්වතිය:
හිතට හිතක් නැත, මෙහෙම හිතක් නැත,
බිනර මලක් ළඟ බඹර නදක් ඇත,
ළං ළං වීලා

"පෙරුම් පුරා ගෙන අපි දකිමින් සිටින හීනය, මෙලෙස ප්‍රේමයෙන්, ආදරයෙන් බැඳී එක්වීමයි" පෙම්වතා පවසයි.

"අප දෙදෙනාගේ එකතුවීම පුදුම බැඳීමක්. බිනර මාසේ පිපී එන බිනර මල වටා ළං වී බඹර ගුමු ගුමුවක් ඇසේ" පෙම්වතිය සතුටින් උතුරා යන හදවතින් කියන්නීය. "පිපී එන බිනර මල" හා "බඹර හඬ" සංකේත වේ. එතුළින් ධ්වනිතවන්නේ පෙම්වතුන් දෙදෙනා ප්‍රේමයෙන් එකතු වී කරන මංගල කතා බහ ය.

මෙය පිටිසර ගම්මානයක යොවුන් පෙම්වතුන් යුවළකගේ සුන්දර, ආදර හමුවීමක චිත්ත රූප මවන ශෘංගාරාත්මක රසවත් ගීතයකි. ශ්‍රාවක මනස තුළ චමත්කාර හැඟීම් ප්‍රබෝධමත් කරයි.

ගී පද රචනය: "බිනර මල", "මාල පබළු වැල්", "තෝඩු අරුංගල්", "හිරි මල් සීපද", "කෝල කොමල ඉඟි", "හීන ඉසව්වේ" යන ගැමි වහරින් සූක්ෂමව තෝරා ගත් ව්‍යංගාර්ථ පිරි පදමාලාව ගීතයෙහි තේමාවට අදාළ හැඟීම් ධ්වනිත කිරීම සඳහා ඉතා උචිත වේ. එසේම වචන එකිනෙකට සම්බන්ධ කිරීමේ දී, වචන තුළින් හැගෙනා වූ අර්ථ පමණක් නොව ගායනයේ දී උචිත ශබ්දයක් ද නැගෙනා පරිදි කල්පනාකාරීව තෝරා ගැනීම උසස් ලක්ෂණයකි. ඒ ලක්ෂණය ගීතයේ රසවත්බව වර්ධනයවීම සඳහා හේතු කාරක වී ඇත. "මාල පබළු වැල් කරවට ලන්නට", "තෝඩු අරුංගල් තැගි ගෙනෙන්නට", "ආල කතන්දර රහස් කියන්නට", "හිතට හිතක් නැත, මෙහෙම හිතක් නැත" යන කාව්‍යෝක්තීන් හොඳ උදාහරණ වේ.

තනුව හා සංගීත නිර්මාණය සහ ගායනය: හදවත පිරි සතුට සොම්නස ධ්වනිත කිරීමට ඉතා උචිත තනු නිර්මාණය මේ ගීතයේ උසස් ලක්ෂණයකි. "ආල කතන්දර රහස් කියනවලු, උං උං අපි ගැන කතා කරනවලු, ළං ළං වී ලා" යන ගී කණ්ඩය ගායනයේ දී නැගෙන උද්වේගකර ස්වර හඬ රටාව, එක් කදිම උදාහරණයකි. ඇගේ හද ගැස්ම තුළ පවතින මංගලමය සන්තෝෂය වදන් රහිත වුවත්, සංගීත ශබ්ද මාධූර්යයෙන් ඒ හැඟීම් ශ්‍රාවක මනසට ධ්වනිත කරයි.

පෙම්වතුන් දෙදෙනාගේ හදවත් තුළ ඒ මොහොතේ පවතින ශෘංගාරාත්මක හැඟීම් ධ්වනිත කිරීම සඳහා සංගීත නිර්මාණය යොදා ගෙන ඇති ආකාරය, ගීතයේ කලාත්මකභාවයට හේතු වූ රමණීය උපක්‍රමයක් වේ.

අමරදේවයන්ගේ හා නන්දා මාලනිය ගේ උචිත මියුරු ගායනා, ගීතයෙහි රසවත් මංගල තේමාව ශ්‍රාවක හදවතට ප්‍රබල මියුරු ස්වරයෙන් රැගෙන ඒමට සමත් වේ.

පද රචනය, තනුව හා සංගීත නිර්මාණය, ගායනය යන ත්‍රිත්ව හැකියාවේ මනා සහසම්බන්ධයෙන් නිර්මාණය වූ "මාල පබලු වැල්" ශෘංගාරාත්මක හැඟීම් ධ්වනිත කරනා රසවත් සුභාවිත ගීතයකි.

**- කරුණාසේන කහටපිටිය**
[karunasena_k@yahoo.com.au]

# සමබරතාව



යුග දිවියක් සාර්ථකව පවත්වගෙන යන්න
සගයෙකු මෙන් සහයෝගය අනිකට ලැබ දෙන්න
නැගණිය, යෙහෙලිය ලෙස තම බිරියට සලකන්න
දිගටම කරතොත් සැමියට වරදින් නෑ ඔන්න

කඟවේනෙක් ලෙස සැමියා උද්‍යෝගෙන් ඉන්න
වගකීමෙන් යුතු බිරියක් ඇති බව සලකන්න
අග හිඟ නැති සතුටින් පිරි දිවියක් ලැබ ගන්න
දිග දුර සිතලා දෙදෙන ම වැඩකරගෙන යන්න

මගදී වුන අකරතැබ්බයෙන් ගැලවී ගන්න
ළඟ උන් බිරියත් සැනෙකින් උර දුන් හැටි මෙන්න
අගයන්නට වටිනව නෙව සමබර කරගන්න
දඟ දානා ඇයහට උපහාරෙකි සලකන්න

**- දක්ෂිණී සාවිත්‍රී ප්‍රනාන්දු ද සිල්වා** [dhakshisfds@gmail.com]



දීපිකා ශ්‍රියානි සුනේත්‍රා වඩුගේ

# සෙනෙහස

සිසිල සඟරාවේ කොටස් වශයෙන් පළවෙන නවකතාව

## මෙතෙක් කතාව

දෙමාපියන් අහිමි අංජලී කුඩා අවධියේ සිට ම හැදුණේ තම නැන්දණිය තලතා, මාමණ්ඩිය බුවනෙක සහ ඔවුන්ගේ දරු දෙදෙනා ළඟයි. තම මව අංජලීට විවාහ යෝජනා සොයන බව දැනගත් බාල පුතු වෛද්‍ය ශිෂ්‍ය සුනෙත් වහාම තම ආදරය අංජලීට පවසන්නට සැරසුනත් ඊට පෙර අංජලී දැක පැහැදුණු සහකාර පොලිස් අධිකාරී හරේන් මංගල යෝජනාවකින් පසුව අංජලීව බැලීමට එනවා. ඒ බව දැනගන්නා සුනෙත් තම මව සමග කෝප වී නිවසෙන් පිටව දුර පලාතක වෙසෙන මිතුරෙකුගේ නිවසට යනවා.

මේ අතර, තලතා සහ බුවනෙක දෙපළගේ ආරාධනයෙන් හරේන් නිවසට පැමිණි විට ඔහුට පවුලේ වැඩිමහල් පුත් ගුවන් හමුදා කපිතාන් දේවක මුල්වරට හමු වෙනවා. දේවක ද මේ යෝජිත විවාහය ගැන ප්‍රසාදයක් නොමැති බව ඔහුගේ හැසිරීමෙන් දෙමව්පියන් දැන ගන්නවා.

මේ අතර, තවමත් මිතුරාගේ නිවසේ රැඳී සිටින සුනෙත් නිවසෙන් ලැබුණු දුරකථන ඇමතුමකින් දැන ගන්නේ අංජලීගේ සහ හරේන්ගේ විවාහය නුදුරේ දී ම සිදුවනු ඇති බවයි. ඔහු තම මිතුරන් දෙදෙනෙකු සමග නිවසට පැමිණෙන්නේ අංජලී පිළිබඳ තම අරමුණ ඉටුකර ගන්නා අදහසිනුයි.

### අද එතැන් සිට

සිය මිතුරන් දෙදෙනා ඔවුන්ගේ කාමරයට ගිය පසු සුනෙත් නැවතත් කල්පනා කරන්නට වූයේ ඔවුන් ගිය ගමනේ ප්‍රතිඵලය කුමක් වී ඇත්දැයි යන්න ය. තාරකී සමග භානුක සහ ආදිත්‍ය කළ කතිකාව දැන ගැනීමට ඔහුට මහත් උනන්දුවක් තිබිණ. ඒ බව මිතුරන් දෙදෙනා හොඳින්ම දැන සිටිය ද ඔවුන් එය පැවසීමට කල්ගන්නේ ඇයි ද යන්න සුනෙත්ට ප්‍රශ්ණයක් වී තිබිණ.



ආදිත්‍ය සහ භානුක ද පත් වී සිටියේ උභතෝකෝටික ප්‍රශ්ණයක ය. සුනෙත් සහ අංජලී එකතු කිරීමට හැකියාවක් තිබේ ද යන්න ගැන තාරකී සමග සාකච්ඡා කිරීමට ඔවුන්ට ගමන යන අතරතුර ම අවස්ථාව ලැබුණි. එහි දී දැනගත් විස්තරයට අනුව ඔවුන් සිතාගෙන පැමිණි කිසිවක් කිරීමට නොහැකි වාතාවරණයක් ඇති බව ඔවුන්ට වැටහී තිබිණ. ඒ ගැන තිබූ සහකම්පනය නිසා ම භානුක සහ ආදිත්‍ය කාමරයට පැමිණ ටික වෙලාවක් එකිනෙකා දෙස නොබලා නිහඬවම සිටියෝය.

"ආදි, මාර වැඩේ නේ මචං, මොනවද බං අපි සුනෙත්ට කියන්නෙ? පවු බං! මොනවද වුණේ කියල කියන තුරු සුනෙත් බලාගෙන ඉන්නෙ..."

"ඒක තමයි භානු මාත් මේ කල්පනා කළේ. තාරකී කිව්ව විදියට එයාගෙ සහන් අයියගෙන් ඇඩ්වයිස් එකක් ගන්නකන් ඉඳිමු ද?"

"ඒ වෙනකක් සුනෙත් බලා ඉන්නෙ නැහැ ආදි. අපි වොෂ් එක අරගෙන ඉවරවෙලා සුනෙත් ගෙ කාමරයට නොගියොත් එයා මේ කාමරේට එන එක ෂුවර්!"

"භානුක අපි මොනව හරි කියන දෙයක් දැනට හදාගමු ද?"

"පිස්සුද මචං? ඊට පස්සේ සුනෙත් ඒ ගැන බලාපොරොත්තු තිබ්බොත් අපි මොනවද කරන්නෙ? ඒක හරිම අවදානම් වැඩක් ආදි!"

තුවාය කරට දා ගත් භානුක නාන කාමරය තුළට ගියේය. ආදිත්‍ය අසල තිබූ පුටුවක් මත හිඳ ගෙන කල්පනාවක නිමග්න විය. තාරකී පැවසූ පරිදි සුනෙත් සහ අංජලී අතර විවාහයක් සිදුවීම ගැන සිතන්නටවත් නොහැකි තත්වයක් ඇති බව ඔහුට වැටහෙමින් තිබිණ.

අංජලී ගේ පියා වූ සම්පත්ගේ සහ මව වූ උත්පලාගේ විවාහය ඇවැස්ස විවාහයක් විය. සම්පත් සහ තලතා ගේ පියා උත්පලා ගේ මවගේ එක්කුස උපන් සොහොයුරා විය.

ඔවුන් දෙදෙනාගේ පියා සහ මව ද ඇවැස්ස නෑනා සහ මස්සිනා ලා ය. දේපල පිට යන හේතුව මත පරම්පරා කිහිපයක් ම මෙලෙස ඇවැස්ස නෑනා සහ මස්සිනා විවාහ සිදුකරගෙන තිබිණ.

සම්පත් සහ තලතා කුඩා කල ඩවුන් සින්ඩ්‍රෝමය සහිත නෑයන් දෙදෙනෙකු දැක තිබිණ. ඒ අතර එවැනි ආබාධ තිබුණ පරම්පරාවේ තවත් අය කුඩා කාලයේ දී ම මියගිය කතන්දර කිහිපයක් ද පවුලේ වැඩිමහළු ඥාතීන්ගෙන් ඔවුන් අසා තිබිණ. ඒ පවුල්වල දරුවන් අතර ඇති ජානගත ආබාධවලට හේතුව ගැන පැරණි පරම්පරාවල අයට අදහසක් නොතිබුණ ද අංජලී ගේ දෙමාපියන් වන සම්පත් සහ උත්පලාට ඒ පිළිබඳව හොඳ අවබෝධයක් තිබිණ. එසේ වුවද ඇවැස්ස නෑනා සහ මස්සිනා අතර ප්‍රේමයක් ඇති වී, ඒ අවදානම ගැන ද නොතකමින්, එය විවාහයක් දක්වා ගියේය. එහෙත් ඔවුන් දරුවන් හැදීමක් ගැන සිතුවේ නැත. සම්පත් සහ තලතාට ද එවන් ආබාධ සහිත වැඩිමහල් සෙහොයුරෙකු සිට ඔහු කුඩා අවදියේ දී ම රෝගයකින් මිය ගිය බව ඔවුහු දැන සිටියහ. උත්පලා කුඩා අවධියේ දී, ඩවුන් සින්ඩ්‍රෝමය ගැන කිසිවක් දැන නොසිටිය ද පාසලේ උසස් පෙළ ජීව විද්‍යාව හදාරද්දී ඒ ගැන ඉගෙනීමට අවස්ථාවක් ලැබිණ. ඇගේ පරම්පරාවල එවැනි ජානගත රෝගයක් තිබීමට හේතුව උත්පලාට ඒ නිසා වටහා ගත හැකි විය.

සම්පත්ගේ පරම්පරාවේ අය ඉඩම්හිමි වැවිලිකරුවන් විය. එම දේපල පිටස්තර අයට අයිති වීම වැලක්වීමට, එවැනි විවාහ ඊට පෙර පරම්පරාවන් කිහිපයකම සිදුව ඇති බව අංජලී ගේ දෙමාපියන් වූ උත්පලා සම්පත් පමණක් නොව තලතා ද දැන සිටියෝය. කෙසේ වෙතත් උත්පලා ගේ මව විවාහ වී ඇත්තේ එලෙස ඇවැස්ස නෑමක් නැති වෙනත් පරම්පරාවක කෙනෙකු සමගය. එහෙත් උත්පලා ගේ මව සහ සම්පත්ගේ පියා යන දෙදෙනාගේ දෙමාපියන් ද ඇවැස්ස විවාහ කරගෙන තිබිණ.

උත්පලා, සම්පත් මෙන්ම තලතා යන තිදෙනාම එම රෝගයේ ස්වභාවය පිළිබඳ දැන සිටිය ද, ඊට කලින් පරම්පරාවල අයට එවැනි උපත් ඇතිවන්නේ ජානගත රෝගයක් නිසාවෙන් යන්න ගැන අවබෝධයක් තිබී නැත. කෙසේ වුව ද නිරෝගී පුද්ගලයන්ගේ වුව ද එම ජාන නිලීන තත්වයෙන් තිබිය හැකි බව වෛද්‍යවරියකව සිටි අංජලී ගේ මව දැන සිටියා ය. එහෙයින් ඇය සහ අංජලීගේ පියා සම්පත් විවාහ වුව ද, දරුවෙකු හැදීම ගැන යම් චකිතයක් තිබී ඇත.

පසු කලෙක සම්පත් ඇමෙරිකානු නාවික සමාගමක රැකියාව ලැබී තම බිරිඳ ද සමග ඇමෙරිකාවට පදිංචියට ගොස් ඇත. එහි දී අයි. වී. එෆ්. තාක්ෂණයෙන් දරුවෙකු බිහිකිරීමට උත්පලා සහ සම්පත් තීරණය කර ඇත්තේ එවිට මවගේ දරුගැබට එක් කරන කළලය එවැනි ජානගත රෝගාබාධ නොමැති එකක් වෙන නිසාය. අංජලී පිළිසිඳගන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. දරුවාට මාස හයක් පමණ ගත වූ පසු උත්පලා නැවත ලංකාවට පැමිණියා ය. ඇය ලබාගත් පස් අවුරුදු නිවාඩුවේ ඉතිරි වූ නිවාඩු කාලය අවලංගු කළ ඇය නැවත සේවය කළ රෝහලේ ම වැඩ භාර ගත්තාය. උත්පලා අංජලීගෙන් පසුව තවත් දරුවෙකු හැදීම නොකළේ එවකට ලංකාවේ අයි. වී. එෆ්. තාක්ෂණය නොතිබුණ හෙයිනි. ඇයට නැවත ඇමෙරිකාවට යාමට ද කැමැත්තක් නොතිබිණ.

උත්පලා සහ සම්පත් පදිංචිව සිට ඇත්තේ තලතා වසන නිවස සහිත පොල් වත්තට යාබදව පිහිටි සම්පත්ට අයිතිව තිබූ පොල් වත්තෙහි තනා තිබූ නිවසේ ය. වතු දෙක අක්කර විස්සක පමණ භූමි භාගයක් පුරා පැතිර තිබුන ද ගෙවල් දෙක තිබුණේ වතු දෙකේ මායිම් අසල ය.

සම්පත් නිවසේ සිටි නොසිටි බොහෝ වේලාවට කුඩා අංජලී සමග උත්පලා සිය ඥාති සොහොයුරිය වූ තලතාගේ නිවසේ රැඳී සිටියාය.

තමා සිය ඇවැස්ස මස්සිනා සමග ප්‍රේම සම්බන්ධයක් ඇති කරගත්තා මෙන් කවදා හෝ සුනෙත් හෝ දේවක අංජලී සමග ප්‍රේම සම්බන්ධතාවයක් ඇති කරගත හොත් ඔවුන්ට තමන්ට මෙන් ගැටළු ඇතිවිය හැකි බව ද, ඔවුන් විවාහ වූවොත් කෙදිනක හෝ දරු උපතක දී පරම්පරාවේ ජානගත රෝගය ඇතිවීමේ සම්භාවිතාව තමාටත් වඩා වැඩිවනු ඇතැයි උත්පලා තලතා සමග පවසා තිබිණ. අංජලී තරුණ දිවියට පත්වන්නට ප්‍රථම තලතාගේ නිවෙසේ සිට දුර ප්‍රදේශයක රෝහලකට යාමට ඇය සැලසුම් කර තිබිණ.

සුනෙත් සහ දේවක සමග අංජලී නිතර හමුවීම වැළැක්වීමෙන් එවැනි තත්වයක් ඇතිවීම නැවැත්විය හැකි යැයි උත්පලා පමණක් නොව තලතා ද සිතුහ.

සම්පත් සුපුරුදු පරිදි නැවේ ගත කරන කාලය අවසන්ව නිවසට පැමිණි එක් නිවාඩුවක දී ඔහු සහ උත්පලා රිය අනතුරකට මුහුණ පා ඔවුන් දෙදෙනාට මෙලොව හැර යාමට සිදුවිය. එවිට අංජලී අවුරුදු තුනක පමණ දරුවෙකුව සිටියා ය.

කෙසේ හෝ සම්පත් සහ උත්පලාගේ මරණයෙන් පසුව අංජලී තම භාරයට ගෙන හදා වඩා ගනිද්දී, උත්පලාට තිබුණ කනස්සල්ල ම තලතාට ද තිබිණ. ඇය නිරන්තරයෙන්ම උත්සාහ කළේ තිදෙනා එක්කුස උපන් සොහොයුරු සොහොයුරියන් සේ හදාවඩාගන්නට ය. එහෙත් ඒ අභිමතාර්ථය ඉටු කරගන්නට නොහැකි වූ බව තලතාට හැඟී ගොස් තිබුණි. ඒ අස්වාභාවික වූ සුනෙත්ගේ හැසිරීම තලතාගේ බලවත් සැකයට හේතු වී තිබිණ. පසුකලෙක හරේන් ගේ මංගල යෝජනාව නිවසට කපුවෙකු මගින් ගෙන එන විට අංජලීට හොඳින්ම ඔහු ගැලපෙනු ඇතැයි තලතා විශ්වාස කළාය. තලතාට අවශ්‍යව තිබුණේ මේ පරම්පරාවේදීවත් නැවත පවුල් දෙක අතර විවාහයක් කිසි ලෙසකින්වත් සිදුවීම වැලක්වීමට ය. යම් හෙයකින් සුනෙත් හෝ දේවක සිය ඥාති සොයුරිය වූ අංජලී සමග එවැනි

ප්‍රේම සම්බන්දයක් පැවැත්වුයේ නම් කිසි ලෙසකින්වත් ඒ දෙදෙනා වෙන් කරන්නට  නොහැකි වනු ඇති බව තලතා දැන සිටියාය.

එක්තරා දිනක දී මේ තොරතුරු තලතා විසින් අංජලී සහ තාරකීට පවසා තිබිණ. ඉන් අනතුරුව තම නැන්දනියගේ සිතැගි ගැන දැනගත් අංජලී වඩ වඩා සුනෙත් ගෙන් ඈත්වන්නට උත්සාහ කළාය.

තාරකී ගෙන් මේ සියල්ල දැන ගත් පසු ආදිත්‍යයට සහ භානුකට ඔවුන්ගේ සියළුම බලාපොරොත්තු සුන්වූවාක් මෙන් දැනෙන්ට වීය.

“ආදි ආ යූ ස්ලීපින් මචං?”

ආදිත්‍ය හිස ඔසවා භානුක දෙස බැලුවේය.

“නෑ භානු, මම කල්පනා කළේ සුනෙත් ගැන.”

“හරි අපි බලමු. මචං ගිහින් ඉක්මනට වොෂ් එකක් ගනින්!”

භානුක තාරකීට දුරකථන ඇමතුමක් ගන්නට උත්සාහ කළේය. එහෙත් එම දුරකතන ඇමතුමට අනෙක් පසින් ප්‍රතිචාරයක් නොලැබිණි. ඔහු සයනය මත හිඳගෙන කෙටි පණිවිඩයක් ලියා ඇය වෙත යැව්වේය. තාරකී සමග ඔවුන් ගිය ගමනේ දී ඇති වූ මිතුරුදම නිසා ඇය බොහෝ කලක් ඇසුරු කර ඇති කුලුපග මිතුරියක ලෙස ඔවුන්ට දැනිණ. ආදිත්‍ය ස්නානය කර ආපසු පැමිණෙන තුරු භානුක ඇඳ මතට වී සුනෙත්ට පැවසිය යුතු දේ කල්පනා කරමින් සිටිය.

දැනගත් තොරතුරු අනුව සුනෙත්ට සහ අංජලීට විවාහයක් ගැන සිතන්නට කෙසේවත් නොහැකි වන බව භානුකට ද වැටහී  තිබිණ. ඔහුට ලොකුම ප්‍රශ්ණය වී තිබුණේ එය සුනෙත්ට පවසන ආකාරය පිළිබඳව ය. ඔහුට සත්‍ය පැවසුවහොත් ඔහු එතැන් සිට දක්වන ප්‍රතිචාර කෙලෙසක වනු ඇතිදැයි ඔහුට සිතා ගත නොහැකි විය.

ටික වේලාවකින් දොරට තට්ටු කරන හඬක් ඇසුණින් භානුක සිය සයනයෙන් නැගිට්ටේය.

එතැන් සිට ලබන කලාපයෙන් කියවන්න.


- **දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ**
[deepikascf@gmail.com]

# කුමාරයෙක්

දාහය ද නිමක් නැත
අගහිඟකම් ද සමගින්
නිවන්නට නැගෙන ගිණි දළු
එන්නේ කවුරු
දරුවන් කර හොවා නැගණිය
නුඹ ඉමක් නොපෙනෙන
දුරක යන්න ද?

පෙනෙන තෙක් මානයක
සරුසාර කෙත් වතු
මැදුරු වේ
සිසිල් මද නළද විඳිමින්
ගයති ගී මැදුරු තුළ
රජවරු සැඳෑ කල
දාහය නොදැනීම රුබර ලියන් ළඟ
මධුපාන සුවඳ වැහේ

ඇස් ගිලිණු කැහැටු කොල්ලෙක්
අර ඈත අවුස්සයි කුණු කසළ
සොයනු වස් ගිලින්නට යමක්



සවන්පෙති හිල්වල
නැතුවාට රන් රිදී
නිතඹ ගස්සමින් ඇය නිවනු වස් ගිණි
ඇදෙන්නේ සයුරුතෙර
හෝටලය අසලට


බිළිඳෙකුගේ මිනිය රැඳවේ
සිහිවිකල් හිමිගේ පපුව මත

මෙවන් දාහයක ගිණි වැල්
නිවනු නැත රජුන්
උහුන් නොදකීය අගුපිල්
නෑසේ ය කෙඳිරිලි
කිරි නොපිරි දෙතනක
එල්ලී හඬන බිළිඳියක

දකින කුමාරයෙක් ඇවිද යයි
නගර දොර
ගම් දනව් සර
අසමින් මධුපානයේ ගී

- **ඩී අමරසිරි ගුණවර්ධන** [amarasiridg@gmail.com]



samanmalee7@hotmail.com

## හරහට

1. දහවලේ දී දැකිය හැක
2. අනුන්ගෙන් යැපේ
5. එගොඩ හා මෙගොඩ යාකරයි (2, 3)
8. අසාර්ථක වූ සංවර්ධන බැංකුවකි (3, 2)
9. පැරණි ගුවන්විදුලි වැඩසටහනකි (3, 3)
11. කැරකේ
12. නොමේරූ
13. නීතිමය පිළිගැනීමක් සහිත
15. මේ ගැන දැන දිවි ගෙවනු මැන (2, 3)
17. සිතට සතුට ගෙන දේ
21. පුරාණ ඉන්දීය නගරයක අද භාවිත නම
23. වැල්
24. ඉතා විශාල
28. යල් පැන ගිය තානාන්තරයකි
29. මුතු මැණික් සේ වටී (2, 3)
31. විටෙක හබන් කුකුළන්ට උදා වේ ලු (2, 3)
32. බිරිඳ
33. එරෙන සුළු පෙදෙස්

## පහළට

1. කඩිසරකම
2. බටලන්ද, එළිය කන්ද උදාහරණ වේ
3. වැඩ පහසුකර දෙයි
4. බද්ධව
5. ඓතිහාසික සටන්බිමකි
6. වර්ණවත් ය. සුළඟේ පාවේ (2, 5)
7. මනුස්සයින්ට වැහෙයි (2, 2)
10. ඔන්චිල්ලාව
14. යහපත් ක්‍රියාවකි
16. නැටුමකි (3, 4)
18. රසවත් කැඳ පානයකි
19. ලජ්ජාව
20. පාලකයින් පිරිසකි
22. සාහිත්‍යයට පරසිදු හිමි නමකි (2, 3)
25. අධික වේදනාවකි (2, 3)
26. මුහුද
27. හේතුව
30. ඓතිහාසික කතාවක් රැගත් චිත්‍රපටයකි


මෙවර ප්‍රහේලිකාවේ විසඳුම ලබන කලාපයේ පළවෙනු ඇත.




# මිනිස් සිරුරේ අඩංගු රසායන මූලද්‍රව්‍ය

මිනිස් සිරුරේ ව්‍යුහය ගැන ගැඹුරින් සලකා බලන විට, එහි අභ්‍යන්තර අවයවවල එකිනෙකට සම්බන්ධවී ක්‍රියාත්මක වන යන්ත්‍රණ ජාලයක් තිබෙන බව අවබෝධ කර ගත හැක. මේ සෑම යන්ත්‍රනයක්ම පාහේ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විවිධ ආකාරයේ රසායනික ප්‍රතික්‍රියා සිය දහස් ගණනක් සිදුවේ. මෙම ප්‍රතික්‍රියා සිදුකරනුයේ ඉතාමත් සීමිත මූලද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩංගු රසායනික සංයෝග මගිනි.


පහත සටහනෙහි දැක්වෙනුයේ මෙම මූලද්‍රව්‍ය එකිනෙකෙහි පරමාණුක ස්කන්ධ අනුව, ක්‍රමානුකූලව පෙළ ගස්වා සකස් කර තිබෙන විශේෂ ආවර්තිතාවගුවකි. ද්විතීය අධ්‍යාපනය ලබද්දී බොහෝ අය දැක හුරු පුරුදු, ආවර්තිතා වගුවට වඩා තරමක් වෙනස් ස්වරූපයක් මෙහි දකින්නට ලැබේ. මෙම සටහනෙහි වර්ණ ගන්වා තිබෙන මූලද්‍රව්‍ය සියල්ලම අඩු වැඩි වශයෙන් මිනිස් සිරුරේ ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වන මූලද්‍රව්‍ය වේ.




වර්තමානයේ දී විද්‍යා කටයුතු සඳහා භාවිතාවෙන සම්පූර්ණ ආවර්තිතා වගුවේ, මූලද්‍රව්‍ය 118 ක් සඳහන් වෙතත්, මිනිස් සිරුරේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන වශයෙන් අවශ්‍යවනුයේ එයින් මූලද්‍රව්‍ය එකොළසක් පමණකි. මෙයින් ද, සිරුර සකස් වී තිබෙන බහුතර පටක පද්ධති සකස්වීම සඳහා අවශ්‍යවනුයේ මූලික ඓන්ද්‍රීය මූලද්‍රව්‍ය (basic organic elements) වශයෙන් හැඳින්වෙන H,C,O සහ N (හයිඩ්‍රජන්, කාබන්, ඔක්සිජන් සහ නයිට්‍රජන්) යන මූලද්‍රව්‍ය සතර වේ. ප්‍රධාන තැනුම් ඒකක (building blocks) සකස් වීම පිණිස ක්‍රියාත්මක වන මෙම “මූලික ඓන්ද්‍රීය මූලද්‍රව්‍ය” ශරීරයේ නොයෙකුත් ව්‍යුහ ගොඩනැගීම සඳහා දායක වේ. උදාහරණයක් වශයෙන්, ශරීරයේ ඇති කාබෝහයිඩ්රේටයක් වන ග්ලූකෝස් සලකා බැලුවහොත්, එහි අණුක සූත්‍රය $C_6H_{12}O_6$ වේ. එනම්, එක් ග්ලූකෝස් අණුවක් සෑදී ඇත්තේ, කාබන් පරමාණු හයක්, හයිඩ්‍රජන් පරමාණු දොළහක් සහ ඔක්සිජන් පරමාණු හයක් රසායනිකව සම්බන්ධ වීමෙනි. මෙම සමූහයේ නැතහොත් තැනුම් ඒකකයේ, පරමාණු විසිහතරකි, මූලද්‍රව්‍ය තුනකි.

එමෙන්ම ශරීරයේ ක්‍රියාවලි සඳහා මූලික ඓන්ද්‍රීය මූලද්‍රව්‍යවලට වඩා බෙහෙවින් අඩු, නියත ප්‍රමාණ වශයෙන් සම්බන්ධ වන ප්‍රාමාණික මූලද්‍රව්‍ය (quantity elements) හතක් ද හඳුනාගෙන තිබේ. මේවා නම් කැල්සියම්, පොස්පරස්, පොටෑසියම්, සෝඩියම්, ක්ලෝරීන්, මැග්නීසියම් සහ සල්ෆර් (Ca, P, K, Na, Cl, Mg, S) යන මූලද්‍රව්‍ය වේ.

මිනිස් සිරුරේ අන්තර්ගත ඉහත දැක්වූ ප්‍රධානතම මූලද්‍රව්‍ය, ශරීර බරෙහි ප්‍රතිශත වශයෙන් දක්වන කළ විට දිස්වනුයේ, පහත දැක්වෙන ආකාරයටය.




| Element | Symbol | Percentage in Body |
|---|---|---|
| Oxygen | O | 65.0 |
| Carbon | C | 18.5 |
| Hydrogen | H | 9.5 |
| Nitrogen | N | 3.2 |
| Calcium | Ca | 1.5 |
| Phosphorus | P | 1.0 |
| Potassium | K | 0.4 |
| Sulfur | S | 0.3 |
| Sodium | Na | 0.2 |
| Chlorine | Cl | 0.2 |
| Magnesium | Mg | 0.1 |
| Trace elements | | less than 1.0 |

මෙහි දැක්වෙන පරිදි දළ වශයෙන්, ඔක්සිජන් (65%), කාබන් (18.5%), හයිඩ්‍රජන් (9.5%) සහ නයිට්‍රජන් (3.2%) ලෙස ශරීරයේ මුළු බරෙන් 96.2% ක් ආවරණය වන බව දකින්නට ලැබේ. මේ ආකාරයට ඉහත දැක්වූ, මූලික ඓන්ද්‍රීය මූලද්‍රව්‍ය සහ ප්‍රාමාණික මූලද්‍රව්‍ය එකොලස මගින් පමණක්, මිනිස් ශරීරයේ සංයුතියෙන් 99.6% ටත් වඩා වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ වන බව ගණනය කර තිබේ.

ශරීර ව්‍යුහයේ ඉතිරි 0.4% කොටසින් ද වැඩි ප්‍රමාණයක් සෑදී ඇත්තේ අත්‍යාවශ්‍ය මූලද්‍රව්‍ය (essential elements) යන නමින් හඳුන්වන තවත් මූලද්‍රව්‍ය අටකින් ය. මේවා නම් Mn, Fe, Co, Cu, Zn, Se, Mb සහ I (මැන්ගනීස්, යකඩ,

කොබෝල්ට්, තඹ, සින්ක්, සෙලීනියම්, මොලිබ්ඩිනම් සහ අයඩින් වේ.

මේ සියල්ලටම අමතරව, ගිණිය නොහැකි තරමේ සියුම් අංශු මාත්‍ර වශයෙන් ශරීරයේ අඩංගු වියහැකි මූලද්‍රව්‍ය ද කිහිපයකි. මේවා ලිතියම් (Li) සිට ටින් (Sn) දක්වා ආවර්තිතා වගුවේ දුඹුරු පැහැයෙන් දක්වා තිබේ.

මිනිස් සිරුරේ බරින් අඩකටත් වැඩියෙන් ඇත්තේ ජලයයි. ජලය හට ගන්නේ හයිඩ්‍රජන් සහ ඔක්සිජන් සංයෝජනය වීමෙනි. සිරුරෙහි සිදුවන දහසකුත් එකක් රසායනික ප්‍රතික්‍රියා සිදුවීමේ මාධ්‍යය ලෙස ජලය ක්‍රියාකරයි. අපගේ ආහාරවලින් ලැබෙන ඉහත සඳහන් කරන ලද සියලුම මූලද්‍රව්‍ය අඩංගු සංයෝග, රසායනික ප්‍රතික්‍රියාවලට භාජනයවීමේ දී, ඒවායේ සංඝටකවල ඉලෙක්ට්‍රොන හුවමාරුවක් සිදු වී, එනම් අයනීකරණය වී, එම අංශු අයන (Ions) බවට පත්වේ. උදාහරණයක් වශයෙන් මිනිස් සිරුරට අවශ්‍ය සෝඩියම් ක්ලෝරයිඩ් ($NaCl$) ජල මාධ්‍යයේ ද්‍රාවණය වූ විට එම සංයෝගය $Na^+$ සහ $Cl^-$ අයන බවට පත්වේ. සෝඩියම් ක්ලෝරයිඩ් සම්බන්ධ වන සියලුම රසායනික ප්‍රතික්‍රියාවල දී සහභාගීවනුයේ මේ ආකාරයට සකස් වන අයන වේ. අනිකුත් සියලුම මූලද්‍රව්‍ය අඩංගු සංයෝග ද ප්‍රතික්‍රියාවලට භාජනවනුයේ මේ ආකාරයට ය.

ශරීරය තුළ ක්‍රියාත්මක වන රසායනික සංයෝග, මේ ආකාරයට අයනීකරණය සඳහා දියවීම පහසු කරවන අපූර්ව මාධ්‍යය ජලය වේ. රසායනික සංයෝග ඉතාමත් වැඩි සංඛ්‍යාවක් ද්‍රාවණය වන නිසා, රසායන විද්‍යාවේදී එය සාර්වත්‍ර ද්‍රාවකය (universal solvent) ලෙසද නම් කෙරේ.

**ප්‍රධාන මූලද්‍රව්‍ය සහ ඒවායේ කෘති**

ශරීරය තුළ, තැනුම් ඒකක සකස් වීම සඳහා අවශ්‍යවන ඉහත සඳහන් මූලද්‍රව්‍ය සහ ඒවායින් සකස්වන විවිධ අයන මගින් ඒවාට ආවේණික සුවිශේෂී කෘති සිදුකරන බව විද්‍යාත්මක පර්යේෂණ මගින් සොයාගෙන තිබේ. මෙම මූලද්‍රව්‍ය සෑම එකක්ම මිනිස් ශරීරයේ මුළු බරෙහි යම්කිසි නියත ප්‍රතිශයක් අනුව පැවතීම සුවිශේෂී කරුණකි. මේ ආකාරයට නියත ලෙස පවතින මූලද්‍රව්‍ය ගැන සලකා බැලීම සඳහා කිලෝග්‍රෑම් අසූවක් බරින් යුක්ත නිරෝගී පුද්ගලයෙකු ආදර්ශය සඳහා තෝරා ගැනීම පහසු පිවිසුමකි.

1. මූලික ජෛන්ද්‍රීය මූලද්‍රව්‍ය: සිරුරේ බර කිලෝග්‍රෑම් අසූවක් වන පුදගලයෙකුගේ බරෙන් 76.8 kg සඳහා දායකවනුයේ, ඔක්සිජන් (52.0 kg), කාබන් (14.4 kg), හයිඩ්‍රජන් (8.0 kg) සහ නයිට්‍රජන් (2.4 kg) යන ප්‍රධාන මූලද්‍රව්‍ය සතර යි. මෙසේ අවශ්‍ය වන ඔක්සිජන් සහ හයිඩ්‍රජන්වලින් වැඩි ප්‍රමාණයක් අන්තර්ගතවනුයේ පටකවල ඇති ජලයේ ය. සිරුරේ සියලුම පරිවෘත්තීය කාර්යයවල දී සහ ස්වසනයේ දී අත්‍යවශ්‍යවනුයේ ද ඔක්සිජන් ය. එමෙන්ම කාබන් පදනම් වූ (carbon based) සංයෝග ලෙස සැලකෙන කාබෝහයිඩ්රේට, ප්‍රෝටීන, මේදය සහ නියුක්ලික් අම්ල වැනි සියලුම තැනුම් ඒකකවල ප්‍රධානතම සංඝටකයක් වන්නේ ද ඔක්සිජන් ය.

මෙම කාබන් පදනම් වූ ඒකක ගොඩනැගීම සඳහා, ඔක්සිජන් තරමටම වැදගත් වන දෙවන මූලද්‍රව්‍යය කාබන් ය. කාබන් සහ හයිඩ්‍රජන් එකතු වීමෙන් සෑදෙන, ලක්ෂ සංඛ්‍යාත කාබන් දාම සහිත හයිඩ්‍රෝකාබන් ව්‍යුහ නිසා ම, මිනිසා ඇතුළු අනෙකුත් උසස් සතුන් “කාබන් පාදක ජීවීන්” ලෙස ද නම් කෙරේ. සිරුරට නයිට්‍රජන් මූලද්‍රව්‍යය බහුලව ලැබෙනුයේ ආහාරවල අන්තර්ගත ප්‍රෝටීන මගිනි. ප්‍රෝටීන ශරීරයට උරා ගැනීම සඳහා, ඒවා වඩාත් සරල ඇමයිනෝ අම්ල බවට පරිවර්තනය වේ. ජීවීන්ට ආවේණික වන, ජනක තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලබන DNA[1] සහ RNA[1] සඳහා මෙන්ම, පටක ඔස්සේ ශක්තිය ගලායාම සඳහා ද උපකාරීවන ATP[2] ක්‍රියාකාරිත්වය සඳහාත් නයිට්‍රජන් අත්‍යවශ්‍ය වේ.

2. ප්‍රාමාණික මූලද්‍රව්‍ය: ඕනෑම පුද්ගලයෙකුගේ වයස, බර වැනි සුවිශේෂී බාහිර සාධකවලට අනුරූපව, ශරීරයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සඳහා නියත ප්‍රමාණ වශයෙන්ම තිබිය යුතු, කැල්සියම්, ෆොස්පරස්, පොටෑසියම්, සෝඩියම් ආදී වශයෙන් දැක්වෙන මූලද්‍රව්‍ය හතක් “ප්‍රාමාණික මූලද්‍රව්‍ය” ගොනුවට වැටේ. ඉහත ආවර්තිතා වගුවේ සහ තීරු ප්‍රස්තාරයේ දක්වා තිබෙන මෙම මූලද්‍රව්‍ය ශරීරය තුළ ක්‍රියාත්මක වන ආකාරය මෙලෙස ය.

මිනිස් සිරුරේ වැඩිපුරම තිබෙන ලෝහමය මූලද්‍රව්‍යයවනුයේ කැල්සියම් ය. අපගේ සැලකිල්ලට භාජනවන කිලෝග්‍රෑම් 80 ක් බරින් යුක්ත මිනිසාගේ සිරුරෙහි, සැකිලි පද්ධතිය (ඇට සැකිල්ල) සහ හිස් කබල, 3.2 kg පමණ බරකින් යුක්ත වන අතර, එහි ඇති සන්ධාරක පටක ශක්තිමත් වීම සඳහා කැල්සියම් 1.12 kg පමණ සංයෝජනය වී තිබේ. ශරීරය ඍජුව තබාගැනීම සඳහා අස්ථිවලින් නිර්මාණය වී තිබෙන සැකිලි පද්ධතිය පිටුවහලක් වේ. එමෙන්ම මෙම පටකවල ක්‍රියාකාරිත්වය සඳහා ෆොස්පරස් ද අවශ්‍ය වේ. මේ සඳහාත් වෙනත් රසායනික ප්‍රතික්‍රියා රාශියක් සඳහා ද ෆොස්පරස් සම්බන්ධ වේ. මිනිස් සිරුරේ ෆොස්පරස් 1.0 kg පමණ තිබේ. ඊට අමතරව මිනිස් දත්වල සංයුතියේ ද කැල්සියම් අඩංගු ය.

අපේ ආහාරයේ ඇති පොටෑසියම් අන්තර්ගත සංයෝගවලින් හටගන්නා $K^+$ අයන මගින් මිනිසාගේ සිරුරේ මනා ස්නායු ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීමටත්, මොළයේ සහ ස්නායු පද්ධතියේ සිට විවිධ අවයවවලට සංඥා සම්ප්‍රේෂණය කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහාත් වැදගත් මෙහෙවරක් කරන බව සොයාගෙන තිබේ. පොටෑසියම් මගින් සිදුවන එම ක්‍රියාවලියට සමගාමීව සෝඩියම් මූලද්‍රව්‍යය සහිත සාමාන්‍ය ලුණු වැනි සංයෝග අයනීකරණය වීමෙන් සෑදෙන $Na^+$ අයන ද මිනිස් සිරුරේ

සුවිශේෂී කෘතියක්වන පටක අතර පෝෂණ ද්‍රව්‍ය හුවමාරුව සඳහා ඉවහල්වන ආශ්‍රැති පීඩනය ප්‍රශස්ත මට්ටමක තබාගැනීම පාලනය කරයි. වැඩුණු මිනිසෙකුගේ ශරීරයේ ඇති පොටෑසියම් 200g සහ සෝඩියම් 120g වැනි සුළු ප්‍රමාණවලින් මෙම ක්‍රියාවලි ක්‍රමානුකූලව පාලනයවීම විශ්මය ජනක ය.

කිලෝග්‍රෑම් අසූවක් බරැති අයෙකුගේ ශරීරය තුළ ක්ලෝරීන් ග්රෑම් 120g පමණ තිබේ. නිරෝගී අයෙකුගේ රුධිර ප්ලාස්මයේ pH අගය 7.38 - 7.42 සීමාව තුළ පැවතිය යුතුය. මේ ආකාරයට රුධිර ප්ලාස්මයේ ආම්ලික / ක්‍ෂාරීය සමතුලිතතාවය පවත්වා ගැනීම පාලනයවනුයේ සෝඩියම් ක්ලෝරයිඩ් වැනි සංයෝගවලින් ලැබෙන Cl- අයන මගින් ය. ශරීරයේ සියලුම පරිවෘත්තීය සහ වර්ධන ක්‍රියාවලි යථා තත්ත්වයේ පවත්වා ගැනීම සඳහා රුධිර ප්ලාස්ම සමතුලිතතාවය ඉතා වැදගත් වේ. අක්මාවේ ක්‍රියාකාරිත්වය මගින් පරිවෘත්තීය අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහාත් ක්ලෝරීන් අවශ්‍ය වේ.

ශරීරයට සල්ෆර් ලැබෙනුයේ සුවිශේෂී ප්‍රෝටීන කිහිපයකිනි. මිනිසාගේ සිරුරේ සල්ෆර් 200g පමණ තිබේ. හිසකෙස් සහ නියපොතු වර්ධනයට අවශ්‍ය "කෙරටින්" නිෂ්පාදනයටත්, සමෙහි මනා සෞඛ්‍යය පවත්වා ගැනීමට අවශ්‍ය වන "කොලජන්" සකස්වීම සඳහාත් සල්ෆර් මූලද්‍රව්‍යය බෙහෙවින් ඉවහල් වේ.

ශරීරයේ ප්‍රාමාණික මූලද්‍රව්‍යවලින් අඩුම ප්‍රතිශතයක් ඇත්තේ මැග්නීසියම් ය. වැඩුණු මිනිසෙකුගේ මැග්නීසියම් ප්‍රමාණය 40g පමණ සීමාවේ. විශේෂයෙන්ම ශරීරයේ ඇති එන්සයිම 300 ක පමණ ක්‍රියාකාරිත්වය හසුරුවනුයේ මැග්නීසියම් මගින් ය.

3. අමතර අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය: මෙම ගොනුවට ගැනෙන මූලද්‍රව්‍ය අටකි. ඉහත ආවර්තිතා වගුවේ පෙන්වා ඇති ද්‍රව්‍ය අතරින් Fe, Cu, Zn, F සහ I (ෆෙරික්, කොපර්, සින්ක්, ෆ්ලොරීන් සහ අයඩින්) මේ අතරින් ඉතාමත් වැදගත් මූලද්‍රව්‍ය වේ. Fe සංකේතයෙන් දැක්වෙන යකඩ, 4.8 g පමණ මිනිස් ශරීරයේ අන්තර්ගත වේ. මෙයින් හටගන්නා Fe 3+ අයන රතු රුධිර සෛලවල ඇති "හීමොග්ලොබින්" (haemoglobin) සංයෝගයේ අන්තර්ගත වේ. රුධිරය මගින් පටකවලට ඔක්සිජන් ප්‍රවාහනය කිරීමේ ප්‍රධාන සාධකය හේමොග්ලොබින් ය. මිනිස් සිරුරේ ඇති, බරින් වැඩිම මූලද්‍රව්‍යය අයඩින් ය. ශරීරයේ 0.0128 g පමණ ඇති මෙම මූලද්‍රව්‍යයේ වැදගත් කෘත්‍යයවනුයේ තයිරොයිඩ් ග්‍රන්ථියේ තයිරොක්සින් හෝමෝනය නිපදවීම උත්තේජනය කිරීමයි. මෙම හෝර්මෝන ඌනතාව ඇතිවිට ගලගණ්ඩ රෝගය හටගනී. ශරීරයේ 3g පමණ ඇති ෆ්ලුවොරීන් (F) මිනිසාගේ යහපත් දන්ත සෞඛ්‍යය සඳහා වැදගත් වන මූලද්‍රව්‍යයකි. මෙම ගොනුවේ ඇති අනිකුත් මූලද්‍රව්‍ය ද විවිධ හෝර්මෝන සහ එන්සයිම වර්ග නිපදවීම සඳහා දායක වන අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය වේ.

4. අවශ්‍ය වියහැකි මූලද්‍රව්‍ය: ආවර්තිතා වගුවේ (Li) සිට ටින් (Sn) දක්වා තිබෙන මූලද්‍රව්‍ය දහය ද, ඉතාමත් සුළු අංශුමාත්‍ර වශයෙන් මිනිස් සිරුරේ තිබෙන බව සොයාගෙන තිබේ. එහෙත් මේවායේ කෘති තිබේද යන්න මතභේදයට තුඩු දී ඇත. මේ අතර ආසනික් (As) වැනි උග්‍ර විෂ සහිත මූලද්‍රව්‍යය ද ඉතාමත් සුළු අංශු මාත්‍රයක් ශරීරයේ තිබීමද පුදුම සහගත ය.

**සෞඛ්‍යය සහ පෝෂණය සඳහා මූලද්‍රව්‍යවල බලපෑම**

මිනිසාගේ ශරීරයේ තැනුම් ඒකක සකස්වීම සඳහා ක්‍රියාකරන මූලද්‍රව්‍යවලින් බහුතරයක් විවිධ ආකාරයට ශරීර සෞඛ්‍යය සහ පෝෂණය සඳහා ද මෙහෙවරක් සිදුවේ. මූලික ජෛන්ද්‍රීය මූලද්‍රව්‍ය කිහිපය ප්‍රධාන වශයෙන් පටක වර්ධන ක්‍රියාවලිය සිදුකරන අතර, සුළු සහ ඉතාමත් සුළු ප්‍රතිශතවලින් පවතින අනිකුත් බොහෝ මූලද්‍රව්‍ය, ක්ෂුද්‍ර පෝෂක වශයෙන් ශරීරයේ පරිවෘත්තීය ක්‍රියාවලි ප්‍රශස්ත මට්ටමෙන් තබාගැනීමට උපකාරී වේ. ක්ෂුද්‍ර පෝෂක ලෙස හැඳින්වෙන විටමින් වර්ග සහ ඛනිජ ද්‍රව්‍ය ඉතාමත් සුළු ප්‍රමාණවලින් ක්‍රියාත්මක වුවත්, ඒවායේ ඌනතාවයක් ඇතිවුවහොත් අවදානම් සෞඛ්‍ය තත්ත්වයක් හෝ සමහර අවස්ථාවලදී ජීවිත තර්ජන පවා ඇතිවිය හැක. එසේම, ආහාරයේ ක්ෂුද්‍ර පෝෂක ඌනතා නිසා මිනිසාගේ වර්ධන සහ චර්යා විෂමතා සහ දුර්වල ශාරීරික ක්‍රියාවලි පමණක් නොව දියවැඩියාව, දෘශ්‍ය ආබාධ, ප්‍රතිශක්ති ඌනතා සහ පිළිකා වැනි රෝග තත්ත්වවලට පවා මුල් විය හැකිය. මෙම පෝෂණ ඌනතා නිසාම, සමහරවිට රටක ආර්ථික ඵලදායිතාවය ද පසුබෑමකට ලක්වනු ඇත.

මිනිසාගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය සහ සනීපාරක්ෂාව රැකදීම සඳහා ඉහත දක්වා ඇති අත්‍යවශ්‍ය ප්‍රාමාණික මූලද්‍රව්‍යවලට අමතරව විටමින් වර්ග ද අති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. ක්ෂුද්‍ර මාත්‍රා වශයෙන් අවශ්‍ය වන මෙම මූලද්‍රව්‍ය සහ විටමින් ඌනතා නිසා මිනිසාට වැළඳෙන රෝගාබාධ රාශියකි. බෝ නොවන රෝග හෝ ආබාධ වශයෙන් හැඳින්වෙන ගලගණ්ඩ රෝගය (goitre), ළමා ශාරීරික සහ මානසික වර්ධන පසුගාමිත්වය, නිදන්ගත ස්වසන ආබාධ, මන්ද බුද්ධිකභාවය, දෘෂ්‍යාබාධ, ග්‍රහණිය (මාන්දම), බැරිබැරියා රෝගය (beri-beri) සහ සමහර අවස්ථාවලදී පිළිකා රෝග ද මේ ඌනතා නිසා හටගත හැක.

දරිද්‍රතාව නිසා අවශ්‍ය ප්‍රමාණයට ආහාර නොගැනීම ද පෝෂණ ඌනතා ලෙඩ රෝග ඇතිවීමට හේතුවකි. මෙම අඩුපාඩුව පිරිමසා ගැනීම සඳහා විවිධ ආකාරයේ අතිරේක පෝෂක නිෂ්පාදනය කර තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ ඒ ඒ රටවල අදාළ අධිකාරී ආයතනවල නිර්දේශ මත නිෂ්පාදනය කෙරෙන මෙම අතිරේක පෝෂක ද්‍රව්‍ය බොහෝවිට විටමින්, ඛනිජ වර්ග, ඇමයිනෝ අම්ල,

එන්සයිම ආදී වශයෙන් පෙති, කරල් සහ "සිරප්" වැනි ස්වරූපයෙන් වෙළඳපලට නිකුත් කර තිබේ. මේවායින් ඒ පෝෂණ ඌනතා බොහෝ දුරට මගහරවා ගත හැක.

**- දයාරත්න වීරසේකර** [dayawee2@yahoo.com]

පාද සටහන්:
රසායනිකව, DNA (ඩිඔක්සි රයිබොනියුක්ලික් අම්ලය) සහ RNA (රයිබෝනියුක්ලික් අම්ලය) බොහෝදුරට ඒකාකාර සංයෝග දෙකකි. කාබන් පරමාණු පහක් බැගින් ඇති රයිබෝස් ලෙස හැඳින්වෙන (ග්ලූකෝස් හෝ ෆෘක්ටෝස්) දාම ඒවායේ පාදක සංඝටක වේ. මෙම සංයෝග ඒවා සමග බැඳී තිබෙන $PO^{4-}$ (ෆොස්ෆේට් අයන) සහ නයිට්‍රජන් මූලික භෂ්ම සමග සම්බන්ධවී තැනුම් ඒකක ලෙස ක්‍රියාත්මක වේ.

ATP (ඇඩිනොසින් ට්‍රයි ෆොස්ෆේට්) යනු ජීවීන්ගේ සෛල මට්ටමේ ශක්තිය ගබඩා කෙරෙන සහ එම ශක්තිය අවශ්‍ය පරිදි වැය කරවනු ලබන, ප්‍රභව වේ. මේවා සෑදෙනුයේ Adenine (ඇඩිනීන්) නම් නයිට්‍රජනිය භෂ්මය, රයිබෝස් ග්ලූකෝස් දාමයක් සහ එයට බැඳී ඇති $PO^{4-}$ කාණ්ඩ තුනක් සමග සංයෝජනය වීමෙනි.

(රූ සටහන්: Wikipedia/Wikimedia)

# සුකොමළ දියවැල



ගිරි ශිඛර මුදුණත
විළිරුදා කෙඳිරිලි මැද
ජනිතව නියං සමයක
සුකොමළ දිය වැලකි මම

වස්සානයේ දවසක
ළඳැලියක වී නොඉඳුළ
මොනර පිල් පැහැයෙන
කඩා හැලෙනා තුරු රුසිරෙන

හරිත වන තිරපට
සඟවා මිනිස් පහසින
ඉර හඳ තරු පොකුරු සැම
විඳි වග නොමද අසිරිය


පරිණත ගඟක හිමිකම
ගම්බිම් නිම්න සරුකොට
සිඳු හිමි වැළඳ සතොසින
කරදිය සළුව පොරවන

යෞවනය පැමිණි නුඹ අත
කුමට අරුමැති කැමරා ඇස
මා රුසිරු පෙන්වූ සඳ
රොද බැඳ ඒවි මනුවිස

**- රුවන්මලී දීපිකා කොඩිකාර**
[ruwanmalekodikara@gmail.com]

*සංනිවේදන ඉතිහාසයේ පිටුවක්*

# මුද්‍රණ කලාවේ අති සුන්දර පිටුව



කඩදාසිය කරා පිවිසුම ගමන්කර
ලොව සංනිවේදන ගමනේ කතන්දර
අඟලින් අඟල අප සමරන මතක්කර
අද රත්තරන් පිටුවක් ඇත එකතුකර

කවුරුත් ලොවේ රාමෙට පොත් කියවනවා
මුද්‍රණ කලාවත් සරුවට වැජඹෙනවා
මුද්‍රණ යන්ත්‍රයක් මුල්වර බිහිවෙනවා
ඒ ගෞරවය ජර්මනියට හිමිවෙනවා

සියවස දාහතර මේ විස්කම කෙරුව
ජොහැන්ස් ගුටෙන්බර්ග් විරුවා එය කෙරුව
කඩදාසිය තින්ත යන්තරයක තිව්ව
දැක ඔහු රුව ද සමරමු බුහුමන් ඇතුව

Images:
wikipedia
cdn.britannica.com

ඉන් පෙර කිසි තැනක ලොව කිසිවෙකු නොකළ
විස්කම වැඩුණි ලොව විකසිත වී පතළ
ඔහු විරුවෙකු උනා මිය ගියමුත් නොමළ
යන්ත්‍රය ඔහු තැනූ දිස්වෙයි මෙහි පහළ



**- නිමල් සේදර** [nimalsedera@yahoo.com]

# පරිවර්තන සාහිත්‍යයෙන්

## පැයක කතාවක්

**Kate Chopin (1894) ලියූ “The Story of an Hour” කෙටිකතාවේ පරිවර්තනය: හෙල්මලී ගුණතිලක**



මැලාර්ඩ් මහත්මිය හෘද රෝගයකින් පෙලුණු කෙනෙකු බැවින් ඇගේ සැමියාගේ මරණය පිළිබඳ ප්‍රවෘත්තිය හැකි තරම් සීරුවෙන් ඇයට සැලකරන්නට මහන්සි ගැනිණි.

ඇගේ සොයුරිය වන ජෝසෆීන් මේ ප්‍රවෘත්තිය ඇයට කීවේ ව්‍යංගාර්ථයෙන් යුතු වූ අසම්පූර්ණ වාක්‍යවලිනි. මැලාර්ඩ් මහත්මියගේ සැමියාගේ මිතුරකු වන රිචර්ඩ් ද ඈ අසල විය. බ්‍රෙන්ට්ලි මැලාර්ඩ්ගේ නම ඉහළින්ම සඳහන් වූ මිය ගිය අයගේ නම් ලයිස්තුව සහිත දුම්රිය අනතුර පිළිබඳ ආරංචිය පුවත්පත් කන්තෝරුවට ලැබෙද්දී, එහි සිටියේ ඔහු ය. තවත් විදුලි පුවතක් යවා මේ ආරංචිය සැක හැර දැනගත් රිචර්ඩ්, වෙනත් අසංවේදී මිතුරෙකු මේ ශෝකජනක පුවත මැලාර්ඩ් මහත්මියට දන්වන්නට පෙර වහා වහා ඇය සොයා පැමිණියේය.

මෙවැනි පුවතක් අසන වෙනත් ගැහැනුන් මෙන් ඈ එය ඇසූ සැණින් විශ්වාස කරන්නට අපහසුව ගල් ගැසී සිටියේ නැත. ආරංචිය කන වැකුණු සැණින් ඇය තම සොයුරිය වැළඳගෙන වියරු ලෙස හඬා වැටුණාය. ශෝකයේ කුණාටුව පහව ගිය පසු තනිවම තම කුටිය වෙත ගිය ඇය, කිසිවෙකුට තමන් සමඟ පැමිණෙන්නට ඉඩ දුන්නේ නැත.

කාමරයේ විවර කර තිබුණු කවුළුව ළඟ, සැප පහසු සනීප පුටුවට ඈ වාරු වූයේ ගත පෙළා ආත්මය වෙත ම කාන්දු වූ අධික වෙහෙසිනි. නිවස ඉදිරිපස චතුරශ්‍රයේ ඇති තුරු මුදුන්, වසන්තයේ අලුත්ම ජීවයෙන් පිරී වෙව්ලනු පෙනුණි. වර්ෂාවේ සුන්දර හුස්ම හාත්පස දැනුණි. දුර ඈත කිසිවෙකු විසින් ගයමින් සිටි ගීයක පද කීපයක් ඇයට යන්තමින් ඇසුණි. අගුවේ බාල්ක අතරේ ගිණිය නොහැකි තරම් ගේ කුරුල්ලෝ කිචි-බිචිගාමින් පසු වූහ. කවුළුවෙන් එපිට බටහිර දෙස අහස වළාකුලින් පිරී තිබුණත් ඒ අතර තැන තැන නිල් අහස ද පෙනුණි.

මැලාර්ඩ් මහත්මිය පුටුවේ කොට්ටය මත හිස රඳවා නිසොල්මන්ව සිටියාය. ඉඳහිට උගුරෙන් නැඟුණු ඉකියකින් ඇගේ සිරුර වෙව්ලනු පෙනුණි. ඇගෙන් දිස්වූයේ නින්ද යනතුරු හඬමින් සිටි දරුවෙකු සිහිනයෙනුත් ඉකිගසන දසුනකි. තරුණ වියේ පසු වූ ඇට තිබුණේ පැහැපත් සන්සුන් මුහුණකි. ඉන් හැඟීම් යටපත් කරගත් බවක් මෙන්ම ශක්තිමත් බවක් ද දිස්විය. නමුත් දැන් නම් ඒ දෑසේ වූයේ මලානික බැල්මකි. ඈත අහසේ වලාකුළු අතර නිල් පදාස වෙත යොමු ව තිබුණු ඒ දෑසේ තිබුණේ ආවර්ජනයට බර බැල්මක් නොව ප්‍රඥාවත් කල්පනාවක ලකුණු ය.

ඈ වෙත යමක් පැමිණෙමින් තිබුණු බව ඇයට දැනුණු අතර, ඈ බියෙන් යුතුව ඒ ගැන අපේක්ෂාවෙන් සිටියාය. ඒ කුමක්ද? ඇය එය නොදැන සිටි අතර එය හඳුනාගැනීමට හෝ නමක් දීමට ඇයට හැකියාවක් තිබුණේ ද නැත. නමුත් අහසින් නික්ම හාත්පස ශබ්ද, සුවඳ සහ පාට හරහා තමන් වෙත එය ළඟා වනු ඇයට දැනුණි.

ඇගේ ළැම වේගයෙන් උස් පහත්විය. ඈ වෙතට පැමිණෙමින් තිබුණු දේ ඈ යන්තමින් හඳුනාගනිමින් සිටියය. ඒ ආවේගය හා සටන් කරන්නට ඇයට අවශ්‍ය වුවත් ඇගේ සිහින් සුදුමැලි දෑත ඊට ශක්තිමත් නොවනු ඇත. ඒ බලවේගයට මඳක් නතු වෙද්දී ඇගේ යන්තමින් විවර ව තිබුණු දෙතොල් අතරින් එකම වචනයක් ගිලිහිණි. ඈ එය නැවත නැවත මිමිණුවා ය: “නිදහස්, නිදහස්!” ඇගේ දෑසේ වූ හිස් බැල්මත්, බියගුළුබවත් අතුරුදන් විය. ඒ දෑස උද්යෝගයෙන් දිලිසුණි. ඇගේ නාඩි වේගවත් වූ අතර, සිරුර පුරා වේගයෙන් ගැලූ රුධිරයෙන් මුළු සිරුරම උණුසුම් වී සන්සුන් විය.

තම සිතේ මේ පිරී ඇත්තේ මහත් ප්‍රීතියක්දැයි සිතන්නට ඈ තාවර නොවූවාය. ඒ මොහොතේ තියුණු ව තිබුණු ඇගේ සංජානනය, ඇයට මේ දැනෙමින් තිබුණු දේ නිර්වචනය කිරීම වැදගත් ලෙස සැලකුවේ නැත.

මරණයේදී ඒ කාරුණික, සිලිටු දෑත එකට බැඳී තිබෙනු දකිද්දීත්, තමා දෙස ආදරයෙන් හැර වෙනත් කිසිම ආකාරයකින් නොබැලූ මුව අළු පැහැතිව නිසොල්මන් ව දකිද්දීත් තමන් නැවතත් වැළපෙනු ඇති බව ඈ දැන සිටියාය. නමුත් ඒ අඳුරු මොහොතට ඔබ්බෙන් ඇති වසර ගණනාවක කාලය තමන්ටම පමණක් අයිතිවන අයුරු ඈ දුටුවාය. ඒ කාලය ආදරයෙන් පිළිගැනීමට ඈ දෑත විවර කළාය. මින් ඉදිරියට තමන් තව කෙනෙකු උදෙසා ජීවත් වීමට අවශ්‍ය නැති වුවත් තමන්ට තමන් වෙනුවෙන් ජීවත්විය හැකි බව ඈ මෙනෙහි කළාය. තම ජීවිතය තුළ තමන්ගේ කැමැත්ත අන්ධව පාගා දමන ප්‍රබල බලාධිකාරයක් යළිත් නොමැති වනු ඇත. මිනිසුන් සහ ගැහැනුන් විවාහය තුළ දී තම කැමැත්ත අනුන් වෙත පැටවීම කරුණාවෙන් සිදු කළත්, කෲර ලෙස සිදු කළත් ඒ අවස්ථා දෙකම අපරාධයක් බව එක් කුඩා මොහොතක දී ඇයට වැටහිණි.

නමුත්, සමහර වෙලාවට පමණක්, ඈ ඔහුට ප්‍රේම කළාය. එහෙත් බොහෝ වෙලාවට එතැන ප්‍රේමයක් තිබුණේ නැත. දැන් මේ කිසිවකින් වැඩක් වේ ද? මේ මොහොතේ ඇයට ඉබේම මෙන්ම ප්‍රබලව දැනෙමින් තිබුණු ස්ථිර ආත්ම විශ්වාසය හමුවේ ප්‍රේමය නම් ලිහනු නොහැකි අභිරහස ගැන කල්පනා කර වැඩක් වේ ද?

“නිදහස්! සිරුරත් ආත්මයත් නිදහස්!”

ජෝසෆීන් වැසූ දොරෙහි අනෙත් පස දණ ගසාගෙන තම දෙතොල යතුරු හිලට තබාගෙන තමන්ට ඇතුළට එන්නට ඉඩදෙන මෙන් ඉල්ලමින් බැගෑපත් වෙමින් සිටියාය. “ලුවීස්, අනේ දොර අරින්නකෝ! ඔයා දැන් අසනීප වෙනවා ඔහොම ඉඳලා, ඔයා මොකද කරන්නේ ලුවීස්? දෙයියන්ගේ නාමෙට දොර අරින්න!”

“ඔතැනින් යන්න, මම අසනීප වෙන්නේ නැහැ.”

ඈ ඒ විවර කවුළුව අද්දර සිට ජීවිතයේ අමෘතය පානය කරමින් සිටියාය. තමන් ඉදිරියේ ඇති දවස් ගැන සිතමින් ඈ රසවත් සිතුවිලි මවමින් සිටියාය. තමන්ටම පමණක් සතුවන අනාගත වසන්ත දවස්, ගිම්හාන දවස්, විවිධ වර්ගයේ දවස්! ජීවිතය බොහෝ දිගු වේවා යැයි ඈ ඉක්මන් යාඥාවක් මිමිණුවාය. ජීවිතය දිගු වැඩිවනු ඇතැයි ඈ අකමැත්තෙන් සිතා තිබුණේ මීට පෙර දවසේය.

ටික වෙලාවකට පසු ඈ තම සොයුරියගේ ඉල්ලීමට කන් දී දොර විවර කළාය. ඇගේ දෑසේ තිබුණේ දිනුමක් ලැබූ කෙනෙකුගේ මෙන් අමුතු ආකාරයේ වියරු පෙනුමකි. නොසිතාම ඈ ඇවිද ගියේ විජයග්‍රහණයේ දෙවඟන මෙනි. මැලාර්ඩ් මහත්මිය තම සොයුරියගේ බඳ වටා අත යවා ඈ සමඟම පඩිපෙළ බැස පහත මාලයට ගියාය. ඔවුන් එනතුරු රිචර්ඩ් පහත මාලයේ බලා සිටියේය.

එවිටම කවුරුන් හෝ පිටත සිට නිවසේ ප්‍රධාන දොරටුව යතුරකින් විවර කරමින් සිටියේය. ඉනික්බිති නිවසට ඇතුළු වූයේ බ්‍රෙන්ට්ලි මැලාර්ඩ් ය. දීර්ඝ ගමනකින් පසු මඳක් වෙහෙස බවක් පෙන්වූ ඔහුගේ අතේ ගමන් මල්ලත් කුඩයත් විය. දුම්රිය අනතුර වූ තැනින් බොහෝ දුරක හිඳ තිබූ ඔහු එවැනි අනතුරක් ගැන දැනගෙන වත් සිටියේ නැත. ජෝසෆීන් ගේ විලාපය ඇසෙද්දී, තමන්ව තම බිරිඳගෙන් මුවා කිරීමට රිචර්ඩ් දරන උත්සාහය දැක පුදුමයට පත් වී ඔහු දොරකඩට වී සිටිවනම බලා සිටියේය.

නමුත් රිචර්ඩ් ප්‍රමාද වැඩි වී තිබිණි.

දොස්තරවරු පැවසුවේ ඇගේ මරණය සිදු ව තිබුණේ හදිසි සතුට නිසා වූ හෘදයාබාධයකින් බවයි.

පරිවර්තනය: **හෙල්මලී ගුණතිලක**
[helmalie999@yahoo.com]

# සිංහල හයිකු

**තාත්තා!**
**මියගිහින් පස් වසක්**
**ඒත් දාඩිය සුවඳ!**

**ගල්පර හමුවේ**
**සිනා සලන**
**ගංගා!**

**සිඳුණු පත්!**
**මහළු තුර**
**මුදිතාවෙන් !**

**රෑ ඇඳිරිය මැදින්**
**බත් වළඳේ**
**පතුල සීරෙන හඬ!**

- ජයන්ත මිහිඳුකුලසූරිය jayanthamihindu@gmail.com




# මගේ රත්තරන් පුතාට තිස් තුන් කෝටියක් දෙවි දේවතාවුන්ගේ පිහිටයි

**2012 මාර්තු 14**



මගේ කාමර සගයින් දෙදෙනාගෙන් ප්‍රංශ ජාතිකයා පැට්‍රික් නමැත්තෙකි. කිසිදු ප්‍රංශ පෙනුමක් නැති ඔහු දුටුමතින් මා විශ්වාස කළේ ඔහු ඉන්දියානුවෙක් විය හැකි බවයි. කඩවසම් ඉන්දීය නළුවෙකුගේ පෙනුමක් පැට්‍රික් හමුවේ දෘශ්‍යමාන විය.

"අහන්න දෙයක් නෑ. මනුස්සය ප්‍රංශ කිව්වට ඉපදිල ඇත්තෙ ඉන්දියාවෙ," මගේ අදහස අනුමත කරමින් ජයන්ත අංකල් ද කීවේ මුලින් නවාතැන බලා යළි ඇල්ගනන් වීදියට රථය පදවමිනි. පැමිණ දින කිහිපයකින් පැට්‍රික් මගේ අදහස සනාථ කළේය.

"මං ඉපදිලා තියෙන්නේ රියුනියන් කියන දූපතේ. ඒක තියෙන්නෙ මැඩගස්කර්වලට ළඟින්. මගේ ඇත්ත අම්ම තාත්ත දෙන්න ඉන්නෙ එහෙ. ඒක ගොඩක් දුරට ඉන්දියන් පෙනුම තියෙන මිනිස්සු ඉන්න, ඉන්දියන් සංස්කෘතියක් තියෙන දූපතක්."

ඉංග්‍රීසි වචන සොයමින් පැට්‍රික් පැහැදිලි කරයි. ප්‍රංශ පවුලක් විසින් දරුකමට සාදාගැනීමට රැගෙන ගොස් ඇති ඔහු සිය වැදූ මව හා පියාට වඩා දැඩිව සැදූ පවුලට ආදරය කරන්නෙකි.

"මේ තමයි මගේ පවුල. මේ මිනිස්සු මට හරිම ආදරෙයි. නොදන්න කාලෙම මම මෙහෙම තැනකට, මෙහෙම රටකට ආවෙ මම වාසනාවන්ත හින්ද."

සැබෑ දෙමාපියන් හමුවට යාම පිළිබඳ මා විමසූ පැනයට ඔහු දුන්නේ එවන් පිළිතුරකි.

"මම 2009 දී එක පාරක් ගියා රියුනියන් වලට. මගේ තාත්ත මැරිල. අම්මා විතරයි මුණ ගැහුණේ. එයා හරියට ඇඬුව. එයා හිතල නෑ කවදාවත් ආයෙම මාව දකින්න ලැබෙයි කියල," ක්‍රමිකව හැඟීම්බර වන පැට්‍රික් සෙමින් මුමුණයි.

සැබෑ ආත්මීය හැඟීම් සන්නිවේදනය කිරීමට අපේ භාෂා ඥාණය පොහොසත් නැත. රැකියා බලපතක් සහිත වීසාවකින් මෙරටට පැමිණ ඇති ඔහු ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කිරීම සඳහා භාෂා පාසැලකට යයි. බසකට පෙරළිය නොහැකි ඔහුගේ හැඟීම් දෙනෙත් හරහා කියවා ගැනීමට මම උත්සාහ කරමි. එහි පතුලත සැඟවුණු වේදනාවක සේයාවක් ලෙස මා කියවා ගන්නේ අම්මාගෙන් දුරස් වීමේ මගේ ආත්මීය වේදනාවම ද?

නිරතුරුව නිවහන විනෝදකාමී ස්ථානයක් කරන්නට සමත් පැට්‍රික්, අහම්බෙන් ප්‍රංශ යුවළක් ඔහු දරුකමට තෝරා ගැනීම වාසනාවක් ලෙස සලකන්නෙකි. එහෙත් සැබෑ ලෙසම මෙවන් සිදුවීමක් හමුවේ කෙළවර නොවන, අප්‍රකාශිත වේදනාවක් ඉතිරි වන බව මට සිතෙයි.

"ආයෙ කවදා හරි මම එහෙ යන්නෙ මගේ හැබෑ මුල් දකින්න ඕන කියල මගෙ දරුවෙක් ඉල්ලුවොත් විතරයි!" සංවේදී වදන් පෙළකින් ඔහු සංවාදය කෙළවර කරයි.

රියුනියන් දේශයේ සිය නිවසට වී, හදිසියේ පැමිණ තමන් හඬවා ගිය ආදරණීය පුතණුවන් යළි එනතුරු මග බලා ඉන්නා මවක් මට මැවෙන්නට ගනියි. ඇය අපේ අම්මාට බෙහෙවින් සමාන ය.

මාත්, අයියාත්, මල්ලීත් පස්වන විය තෙක් සිය උණුසුමෙහි සාදාගත් අපේ අම්මාට ඉන් අනතුරුව දරුවන්ගේ පාසැල් අධ්‍යාපනය සඳහා අප මහගෙදරට එවන්නට සිදුව ඇත. මාඋස්සාව, රාක්ෂාව, වුඩ්සයිඩ් හා හාතලේ රාජ්‍ය තේ වතු

සමාගම්වල ලිපිකරුවකු ලෙස සේවය කළ තාත්තී, එම සේවා ස්ථාන හරහා ලැබෙන නිල නිවාසවල නතරවද්දී ම අම්මාගෙන් අපත්, අපෙන් අම්මාත් වෙන් කිරීමේ පිඹුරුපත් සැකසී තිබිණි. තාත්තීගේ මැණියන් වූ ආච්චී සහ නැගණිය වූ නැන්දා සමග මහගෙදර වාසය අම්මාගෙන් වෙන්වීමේ වේදනාව අවම කළ පරිසරයකින් යුක්ත විය. නැන්දා සහ ආච්චීට අමතරව බාප්පලාගේ ඇසුරත්, අසල්වැසි නෑසියන්ගේ සෙවිල්ලත් අප තිදෙනාගේ පාසැල් සමය තෘප්තිකර කාලයක් බවට පත් කළේ ය.

එහෙත් පාසැල් නිවාඩු සමය කෙළවර අපෙන් සමුගන්නා අම්මා, තනිව වතු නිල නිවසේ කෙසේ කල් අරින්නට ඇත්දැයි මම නොදනිමි. කාර්යාල සේවයට උදෑසන නිවසින් සමුගන්නා තාත්තී යළි නිවසට එන්නේ දිවා ආහාරයට හෝ සවස සේවය නිමා කිරීමෙන් අනතුරුව ය. සිය සේවය වෙනුවෙන් දැඩි කැපවීමක් දැක්වූ ඔහු ඇතැම් වැඩ අධික දිනවල කාර්යාල ලේඛණ හා පොත් පත් නිවසට ද රැගෙන එයි. මිතුරිය ලීලාට ලිපි ලිවීම, කවි පබැඳීම, මැහුම් හා ගෙත්තම් කිරීම, ගුවන් විදුලියට සවන් දීම ආදිය හරහා අප තිදෙනා අසළ නොමැති වේදනාව කොතරම් දුරට මනසින් මකාගත්තේදැයි ඇය විමසන්නට කාලයක් මට නොලැබුණි. තාත්තීගේ විශ්‍රාමයාමත් සමග මහගෙදරට පැමිණ නොබෝ කලකින්ම ඇය රෝගාතුර වූවා ය.


රීජන්ට් වීදියට පැමිණි නොබෝ දිනකින් ම සොයුරු හැඟීමකින් සමීප වූ පැට්‍රික්ගේ සැබෑ අම්මා, මහගෙදර සිට ස්කයිප් හරහා මා අමතන අම්මා ම විය නොහැකි ද? පුතණුවන් දුරස්වීමේ වේදනාව දරාගත නොහී අම්මාගේ නෙතින් ගලන කඳුළු දුටු පැට්‍රික් මෙන් අපේ අම්මා හඬනු මා දැක නැත. අප ඉදිරියේ කඳුළු නොසැලූ ඇය වසර විසි තිස් ගණනක වේදනාව රෝගයක් ලෙස පිට කළා ය.

“මගේ රත්තරන් පුතාට තිස් තුන් කෝටියක් දෙවි දේවතාවුන්ගේ පිහිටයි!”

සිය රෝගය උත්සන්න මොහොතක වුව අම්මාගේ මුවින් නිතැතින් පිටවන මෙම වදන් පෙළ තනිව වතු නිල නිවසේ කල් ගෙවූ යුගයේ අපමණ වතාවක් මුමුණන්නට ඇත. අහම්බ මොහොතක සිය දෙනෙත් අභියස ජීවමාන වී යළි නොපෙනී ගිය කඩවසම් පුතු සිහිකර කඳුළු පිරි මුවින් පැට්‍රික්ගේ සැබෑ මව ද ඔවැනිම පැතුමක් මුමුණනු ඇත.

- **ප්‍රියන්ත ෆොන්සේකා** [shanthalalf@gmail.com]

# කන්ථක නොවන ස්ත්‍රිය



දුකම උහුලා ගන්න නොහැකිව
ලය පැලී ගිය අශ්ව කන්ථක
ආදරේ බව සගවගන්නට
බැරුව හැඩුවා ඇයත් ඉකිබිඳ

සසරෙ කල පින් ඇතිම හින්දා
දුක් විදින්නට නොහැකි වූවා
සසරෙ පව් කද වැඩිම හින්දා
ඇයත් ගින්දර මතම උන්නා

වෙන්වීම කෙලවරක් වුව ද
හදෙහි උතුරන ආලෙ හින්දා
අශ්ව කන්ථක යලි උපන්නට
දිව්‍ය භවනට වැඩම උන්නා

රැගෙන යන්නට මහ හුගක් දුක්
ඇයම සසරේ නතර වූවා
වසර දෙදහස් ගණනකට පසු
ඇයට කන්ථක වෙන්න බැරුවා

- **ලෝචනී අමරසූරිය**
[lochaniamarasooriya733@gmail.com]

# හිරු සැඳෑ සක්මන



රත් පැහැය තවරා
අවරදිග අහස් ගැබ
හෙන්දිරික්කා මල් යාය
පුබුදුවා වැට අයිනේ
හිරු සැඳෑ සක්මනේ

කැඳලි වෙත පියඹාන
විහඟ ගී නාද මැද
සිසිල් සුළගේ දැවටී
ගිලිහෙනා පත් මතින්
හිරු සැඳෑ සක්මනේ


නිමාකර මෙහෙවර
ඉසිඹුවක් සොයාගෙන
තිමිරයේ සළු අරන්
හිරු සැඳෑ සක්මනේ

- **අමිතා පද්මකුමාරි**
[amithapadamakumari
@gmail.com]

සිසිල කෙටිකතාව

# හේතු

**අනුරුද්ධ වැලිගමගේ**



“දඩාස්” ඉස්සරහ සීට් එකේ තිබුණු ෆයිල් මිටිය බිමට වැටුණා. ඒ දිල්කිට හදිස්සියේම වාහනේ බ්රේක් කරන්න වුනු හින්ද. තමන්ගෙ ධාවන පථයට එහා මං තීරුවෙ ඉඳන් තරුණ කාන්තාවක් වාහනය කැපුවෙ අනපේක්ෂිත විදිහට.

අද දවස හරිම කාර්ය බහුලයි. දිල්කිට දවසේ වැඩ ටික එකින් එක සිහියට නැගුණා. උදේ නමයට දික්කසාද නඩුවකට එන ඉන්දීය යුවලක්. දවල් දොළහට දූෂණයට ලක් වූ තරුණියක් සම්බන්ධ පූර්ව සංවාදයක්. හවස හතරට ආරාධිත දේශනයක්.

ඊත් එක්කම ලබන සතියෙ පටිගත කෙරෙන “ටෙඩ් ටෝක්ස්” මහජන දේශනයකට දිල්කිට ආරාධනාවක් ලැබී තිබුණා. ඒ විශ්වවිද්‍යාලයේ තරුණ ශිෂ්‍යාවන්ට ඇය කළ දේශණ කිහිපයක වීඩියෝ ඉන්ටර්නෙට් එකේ සංසරණය වන හින්දයි.

ඒකට කොහොම කථාවක් කරනවද කියල තාම දිල්කිට අදහසක් නැහැ. හැබැයි හොඳට හැමෝටම දැනෙන කතාවක් කරන්න ඕන. මොකද මේක ජාත්‍යන්තරයට ම යන එකක්නෙ.

එක පාරට ම කහ එළිය වැටුණා. වාහනය ධාවනය කළ වේගයත් එක්ක යන්න බැහැ.

ඊළගට වැටුණෙ රතු එළිය. අකමැත්තෙන් වුණත් වාහනය විනාඩි කිහිපයකට නතර කරන්න වුණා.

හොඳින් ගලාගිය තමන්ගෙ ජීවිතයටත් ඒ වගේම රතු එළියක් වැටුණු හැටි?

දිල්කිට මතක්වුණේ අවුරුදු තුනකට කලින් තමන්ට අත්දකින්නට වුනු ඒ සිද්ධිය. ඒක කොහොම අමතක කරන්නද?

“ඒක ටෙඩ් දේශනයට හොඳයි නේද?” ඇයට හිතුණා.

* * *

දිනය: 2020 ඔක්තෝබර් 30,
වේලාව: පස්වරු 7.30
ස්ථානය: ඇල්ෆ්‍රඩ් රෝහල

වෛද්‍ය ඩන්කන්: “ඇයි චරිත්ට සියදිවි නසා ගන්න හිතුණේ?”

චරිත් රත්වත්ත: “ඩොක්ටර් මම අද හවස හාඩ්වෙයා ස්ටෝස් එකට ගියපු වෙලාවේ මට එතනදි හම්බ වෙච්ච යාළුවෙක් කියපු කතාවක් හින්දා.”

වෛද්‍ය ඩන්කන්: “මොකක්ද චරිත්ට යාළුවා කිව්වේ?”

චරිත් රත්වත්ත: “උඹ දන්නව ද ඇයි දිල් උඹේ ගැනිට ගැහැව්වෙ කියල මිහිහ මගෙන් ඇහැව්වා.”

වෛද්‍ය ඩන්කන්: “ඉතින් එතකොට ඔබ මොකක්ද කිව්වේ?”

චරිත් රත්වත්ත: “මටත් තවම හිතාගන්නවත් බෑ මචං. මම අද රෑට සමදරාගෙන් ම අහන්නයි ඉන්නේ කියලා. මෙන්න එතකොටම යාළුවා කියපි, බලන් හිටපන්, උඹට ඔන්න කියල කියයි. උඹ දන්නවද සමදරා හොර මිනිහෙක් එක්ක ඉන්නවා දිල්ට මාට්ටුවෙලා බව?”

වෛද්‍ය ඩන්කන්: “සමදරා කියන්නේ ඔබේ බිරිඳ වෙන්න ඕන. එතකොට ඔබ ඒ කතාව විශ්වාස කරනව ද?”

චරිත් රත්වත්ත: “ඔව් ඩොක්ටර්, සමදරා කියන්නේ මගේ වයිෆ් තමයි. ඒ කතාව ඇහුවම මට හරිම පුදුමයි. මගේ නෝනා වැඩ කරන්නේ නැෂනල් බැංකුවේ විගණන අංශයේ. ඉතින් මාස කීපයකට සැරයක් ඇය තවත් කිහිප දෙනෙකුත් එක්ක විවිධ නගරවලට රාජකාරි කරන්න යනවා. අදත් එයා වැඩට ගියා. මීටින් එකක් හින්ද ටිකක් රෑ වෙනවත් කියල කිව්වා. ඉතින් මම එතනදී ම සමදරාට කතා

කරා. කිසි උත්තරයක් නෑ. ෆෝන් එක බිසී. මැසේජ් එකකුත් දැම්මා."

වෛද්‍ය ඩන්කන්: "ඔබට තිබුණේ බිරිඳ එක්ක මේ ගැන කතා කරල මේ ගැන දැනගන්න නේද? තුන්වෙනි පාර්ශවයක් කියන කතාවකින් ඔබ වගේ උගත් කෙනෙක් තීරණයක් ගන්න එක හරි මදි නේද?"

චරිත් රත්වත්ත: ඒ වෙලාවේ මට ඇතිවෙච්ච තරහා කියන්න බැරි තරම්. විශේෂයෙන්ම ටෙලිෆෝන් එකට කතා නොකර හින්දා මගේ තරහත් තවත් ඇවිස්සුණා. එතකොටම තමයි මහින්ද "ජේන් නෝනා" කියන ෆේස්බුක් ගොසිප් පිටුවේ තිබ්ච්ච පෝස්ට් එකක් WhatsApp හරහා එවල තිබුණේ. ඒකෙ තිබුණෙ සමදරා, මයික් කියන බැංකුවේ ස්ටාෆ් එකේ කෙනෙක් එක්ක මියුසිකල් ෂෝ එකක් බලන්න ගිහින් තුරුළුවෙලා ඉන්න ෆොටෝ එකක්."

"පැයකට පස්සෙ සමදරා කතා කරා. ඇයි හදිස්සියක් ද පැටියො? මං එනකොට චුට්ටක් රෑ වෙයි. මම රෑට කාලයි එන්නෙ කියල කිව්වා."

"මම එතකොට ම අර ෆොටෝ එකට එයාට යවල මේ ෆොටෝ එක ඇත්තක් ද? කියල ඇහුවා."

"සමදරාට එකපාරටම තරහා ගියා. ගහෙන් ගෙඩි එන්නා වගේ කිව්වා, ඔව් ඒක ඇත්ත තමයි ඕයි. තමුසෙ හැම තිස්සෙම පන්සල බදාගෙන හිටියට මටත් හැඟීම් දැනීම් තියෙනවනෙ, කියලා!"

වෛද්‍ය ඩන්කන්: "ඉතින් ඔබට තිබුණෙ ලයිෆ්ලයින් වගේ සර්විස් එකකට කතා කරන්න නේ. එතකොට උදව්වක් ගන්න තිබුන නෙ."

චරිත් රත්වත්ත: "ඩොක්ට නම් ලේසියෙන් කියයි. ඔන්න එතකොටම ෆෝන් එකේ ෆේස්බුක් දැනුම් දීමක් ආවා. වල් ජෝන් කියල කෙනෙක් පොස්ට් එකක් දාල මාව ටැග් කරලා. බීච් එකක මයික් එක්ක සමදරා නාන ඇඳුමෙන් ඉන්න සෙල්ෆි එකක්. ඒකෙ තිබුණෙ - සභාපති බුදුන් වඳී, සමදරා නිදිවදී- කියල. අපි අවුරුදු හතක් යාළුවෙලා ඉඳලා බැන්දේ ඩොක්ට. මම කවදාවත් සමදරා මෙහෙම කරයි කියල හිතුවෙ නැහැ. මං මේ ළඟ පන්සලේ දායක සභාවේ සභාපති. මට අපේ සමාජයේ ගොඩක් දෙනෙකුගෙ හොඳ පිළිගැනීමක් තියෙනවා. කිහිප දෙනෙක් නම් මාත් එක්ක තරහයි කියල අහල තියෙනවා. ඒත් දැනුවත්ව නම් කවුරුත් මට මුකුත් නරකක් කියල නැහැ."

වෛද්‍ය ඩන්කන්: "දුව තමයි ඇම්බියුලන්ස් එකට කතා කරලා ඔයාව හොස්පිටල් ගෙනත් තිබුණෙ. අන්තිමට ඔයාට මතක මොනවද?"

චරිත් රත්වත්ත: "මට ජීවිතේම එපා වුණා. නෑදෑයෝ, යාළුවො මොනවා කියයිද කියලා හිතුණා. මම හරි හොඳින් ජීවත්වුණු කෙනෙක්. මම සමදරාටවත්, දරුවන්ටවත් වරදක් කරලා නැහැ. මට අහුවුනේ හිසරදයට ගන්න බෙහෙත් පෙති කුප්පිය. මං ඒකෙ තිබ්බ පෙති තිහක් විතර දිගටම ගිල්ලා."

* * *

දිනය: 2020 ඔක්තෝබර් 30, වේලාව: පෙරවරු 10.30
ස්ථානය: මහේස්ත්‍රාත් අධිකරණය

පැමිණිල්ලේ නීතිඥ: "එම්පෝරියම් සාප්පු සංකීර්ණයේ රථගාලේ දී ඔබ සමදරාට ගැහුවෙ ඇයි?"

දිල්කි වත්සලා දිසානායක: "මට හිතන්නෙ හේතුව ක්ෂණික කෝපය. මං ඒ වෙනකොට සමදරා ඇන්ටි ගැන පුදුම තරහකින් හිටියෙ. රන්මිණි කියන මගේ වයසෙම දුවෙක් හිටියත් සමදරා ඇන්ටි හරිම තරුණ පාටයි. හොඳ මූණක් පෙන්නගෙන හිටියට එයාගෙ වැඩ ගැන මං එච්චර පැහැදීමකින් නෙවෙයි හිටියෙ. ආසන්නත ම හේතුව විජේරත්න කියන සල්ලාල ලංකාවේ කැබිනට් ඇමැතිවරයා මෙහේ හිටිය කාලේ එයාට තනි රකින්න එයා හිටපු එපාර්ට්මන්ට් එකට එන්න කියල නාඳුනන කෙනෙක් කථා කරපු එක."

පැමිණිල්ලේ නීතිඥ: "ඒකයි සමදරාට පහර දීමයි අතර තියෙන සම්බන්ධය?"

දිල්කි වත්සලා දිසානායක: "ආට් ගැලරිවල චිත්‍ර අඳින එක එකාට රෙද්ද උස්සලා පෙන්නන එකීට විජේරත්න ඇමතිට තනි රකින එක මහ කජ්ජක් ද කියල සමදරා අක්කා තමයි මේ නොම්මරේ දීලා ගණන් කථා කරගන්න කිව්වෙ කියල ඒ කෝල් කරපු කෙනා කිව්වා."

විත්තියේ නීතිඥ: "මේ පහරදීම ක්ෂණික ක්‍රියාවක් විදිහට පෙනුණත් මේ තත්වයට ඇය පත්වුණේ සමදරා වාචිකව ඇයට පන්සලේදීත්, සමාජ මාධ්‍ය හරහාත් විශාල වශයෙන් අපහාස කරලා තියෙන හින්දයි. ඒ හින්ද ගරු විනිසුරුතුමාගෙන් මම ඉල්ලා සිටිනවා හත්මාළුව, පැණිවරකා සහ නුවර කොල්ලෝ කියන ෆේස්බුක් ගිණුම් හිමි අයගේ තොරතුරු ලබාගන්න වගේම ඒවා සංසරණය කරන තොරතුරු වාරණය කරන්න නියෝගයක් නිකුත් කරන්න කියල."

විනිසුරුතුමා: "දිල්කිට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්ද?"

දිල්කි වත්සලා දිසානායක: "ඔව් සමදරා ඇන්ටි හැබෑ නමින් වගේම ව්‍යාජ ෆේස්බුක් එකවුන්ට් හරහා පහුගිය මාස දෙකේ දී මගේ ආත්ම ගෞරවය කෙලෙසෙන අන්දමේ බොහෝ දේ කරලා තියෙනවා. ළඟදි පන්සලට ගියපු වෙලාවෙ මං තරමක් ඇඟට හිරවෙන ඇඳුමක් ඇඳගෙන හිටියෙ මම කැම්පස් ගිහින් එන ගමන් ආව හින්ද. ඒත් ඇන්ටි ඒක මහ ලොකු වරදක් විදිහටයි මට කෑ ගැහුවෙ. එයාගෙ දුව සමහර වෙලාවට ඊට වඩා ඇඟ පේන ඇඳුම් ඇඳගෙන පන්සලේ ඉන්නවා මම දැකලා තියෙනවා. මම ඒකට ඇත්ත හේතුව දන්නෙ නැහැ. හැබැයි ඇය මා කෙරේ පුදුම ද්වේශයකින් තමයි හිටියෙ."

විනිසුරු තුමා: "ඔබට ඒ ගැන සාක්ෂි තියෙනවද? ඔබට විස්තර කියන්න පුළුවන්."

දිල්කි වත්සලා දිසානායක: "ඔව් මට පුළුවන්."

දිල්කි වත්සලා දිසානායක: (දුරකථනය පෙන්වමින්) "මේ හත්මාළුව කියන ප්‍රොෆයිල් එකෙන්, නුවර කොල්ලෝ කියන එකෙන්, මං පන්සලේ පිරිත් නූලක් බඳින වෙලාවක ගත්තු ෆොටෝ එකකට දාල තිබුණු කමෙන්ට්, -හාමුදුරුවොත් ඉවරයි-, -පපුව පෙන්නන විදිහට සාදුගෙ සිල් කැඩෙයි කෙල්ලෙ-, -දවසක අපටත් බැරි ද?-"

"මේ තවත් එකක්. මේ පැණිවරකා, උඩරට හැදියාව, හයි ස්කූල් කෙල්ලෝ කියන ප්‍රොෆයිල්වලින් යට ඇඳුම් ඇඩ් එකකට මම කළ ෆොටෝ එකකට ලියල තිබුණු දේවල්, -මේකෙ ඇගේ නූල් පටවල් දෙකයි-, -නුවරම කන එකී-, -සල්ලිවලට ඕන දෙයක්!-"

"මං විශ්වවිද්‍යාලෙ වියදමට අමතර ආදායමක් විදිහට මොඩලින් කරන කෙනෙක්. නුවර අපේ ඉස්කෝලෙ ලොකු අක්කා කෙනෙක් හින්ද මං මගේ ගොඩක් පුද්ගලික විස්තර ඇන්ටිට කියල තියෙනවා. මං හිතන් හිටියෙ මගේ වයසෙ දුවෙක් ඉන්න අම්මා කෙනෙක් හින්ද ඇය හොඳ ගැහැණියක් කියලයි."

* * *

දිනය: 2020 ඔක්තෝබර් 30, වේලාව: පෙරවරු 11.30

ස්ථානය: ජූරි සභා කමිටු කාමරය, මහේස්ත්‍රාත් අධිකරණය

නඩුවේ ජූරි සභිකයින්ගේ සාකච්ඡාවේ දී ඇතිවුණු කතාබහෙන් කොටසක්.

මිලර් මහත්මිය: "දිල්කි කියන විදිහට ඇගේ එක අර්ධ කාලීන රැකියාවක් වෙන්නෙ යුනිවර්සිටියේ චිත්‍ර කලාගාරයේ නිරුවත් නිරූපිකාවක් විදිහට කටයුතු කරන එකයි. ඇය සමහර වෙලාවට වෙනත් නගරවලටත් නිරූපණ සඳහා යනවා. ඒ වගේම තවත් අමතර ආදායම් මාර්ගයක් විදිහට Kat the Label ආයතනයේ කාන්තා යට ඇඳුම් සහ නිදන ඇඳුම් නිරූපිකාවක් විදිහටත් අන්තර්ජාල සහ මුද්‍රිත දැන්වීම් සඳහා පෙනී ඉන්නවා. ලංකාවෙත් ඇය කෙටි කලක් නිරූපිකාවක් විදිහට කටයුතු කරලා තියෙනවා. දකුණු ආසියානු කලාපීය සංස්කෘතිය අනුව කාන්තාවන් අඟපසඟ පෙනෙන විදිහට නිරූපණ කටයුතු කරන එක තරමක් රැඩිකල් වැඩක්. මට පෙනෙන විදිහට සමදරා සමාජ මාධ්‍යය හරහා විවිධ නම්වලින් ඇයට මඩ අපහාස කරලා තියෙන විදිහට සමාජයෙන් එන පීඩනය ඉදිරියේ දිල්කි කෝප ගැන්වෙන්න පුළුවන්."

බාතියා මහතා: "සමදරා ඇගේ ප්‍රකාශවල දී කියූ විදිහට මීට මාස තුනකට කලින් දවසක් ඇයට දිල්කිව හමුවෙන්නෙ ඇය වේටර්වරියක් විදිහට සේවය කල අවන්හලේ දී. එතකොට ඇය කිව්වා කියන්නෙ -ඇන්ටි කීප දවසක් සුදු මහත්මයෙක් එක්ක කෑම ගන්නවා දැක්කා. අද තමයි කථා කරන්න ලැබුනෙ- කියලා. ඒ වගේම මීට මාස දෙකකට කලින් වෙනත් නගරයක හොටේල් එකක දී සමදරාට දිල්කිව මුණ ගැහුණාම කිව්වලු -ඇන්ටිලාව මං ඊයේත් දැක්කා, මම විෂුවල් ආට් ඇකඩමි එකේ මොඩලින් වලට ආවා- කියල. මට හිතෙන්නෙ සමදරා හිතන්න ඇති දිල්කි මේ ගැන චරිත්ට, රන්මිණිට, සමාජයට කියයි කියල. මොකද දැන් දවස් කීපයක් අතට ම අහුවුණා නෙ. සමදරාට පන්සලේ දී කීප දෙනෙක් ම කියල තියෙනවා -අපි දැක්කා ඔයා අර සුදු කොල්ලෙක් එක්ක එහෙ මෙහෙ ඉන්න ෆොටෝ ටිකක්- කියා. සමදරා ඒ ෆොටෝ ගැන සැක කරන්නෙ දිල්කිව. මොකද එයාට ෆොටෝ ගන්න ඕන තරම් අවස්ථා තිබුන නෙ."

ෆැල්වීනෝ මෙනෙවිය: "හ්ම්, අපි මෙහෙම හිතමු. සමදරා හිතුව මයික් කියන කන්තෝරු සගයා එක්ක සමදරා තියෙන සම්බන්ධය පවුලටත්, දන්න අයටත් කියයි කියල. ෆොටෝ දැක්කයි කියල කියන අයගෙන් ඒවා ඉල්ලන්න බැරි හින්ද හිතන්න ඇති දිල්කි තමයි මේ ෆොටෝ අරන් සමාජ මාධ්‍යවලට දාන්නෙ කියලා. ඒ හින්ද දිල්කි පාලනය කරන්න ඇයට මඩ ගහන්න ඇති. දිල්කිගේ ෆොටෝ, තරුණ වියේ හැසිරීම් ලංකාවෙ සමාජය එතරම් අනුමත නොකරන, සංවර නොවන ඒවා හින්ද දිල්කිව පාලනය කරන්න හිතාගෙන සමදරා ෆේක් ප්‍රොෆයිල් හදල කමෙන්ට් දාන්න ඇති."

බාතියා මහතා: "ඒත් එහෙම කියලා දිල්කි සමදරාට ප්‍රසිද්ධ ස්ථානයක දී පහර දීම පිළිගන්න බැහැ නෙ?"

මිලර් මහත්මිය: "ඒකට මං එකඟයි. ඇය නිරූපිකාවක් විදිහට චිත්‍ර සඳහා නිරුවත්වුණා සහ දැන්වීම් සඳහා අඩ නිරුවත්වුණා තමයි. ඒත් ඇය ලිංගික ශ්‍රමිකයෙක් නෙවෙයි. මං කාන්තාවක් විදිහට සමදරා කළ අපහාසයට තදින් විරුද්ධ වෙනවා. ෆැල්වීනෝ මෙනෙවිය, භාතියා මහත්තයා මොකද කියන්නෙ? ඒක බරපතල වරදක්. ඒ වගේ දෙයකින් කාන්තාවක් කෝප ගැන්වෙන්නෙ නැත්නම් තමයි පුදුමෙ."

* * *

තරුණ කාන්තාවනට තමන්ගෙ කථාවෙන් ගන්න යමක් තියේවි කියල දිල්කිට හිතුණා. ඇයට ආපහු නඩුව මතක්වුණා. විනිසුරුවරයාගේ තීරණය, සමදරා ඇන්ටිට නියම කළ දඩය, දිල්කිට කළ අවවාද. රස්සාවෙන් විශ්‍රාම අරන්, ගෙදරත් විකුණලා රන්මිණි, සමදරා ඇන්ටි, චරිත් අංකල් එක්ක බ්‍රිස්බේන් යන්න කලින් ඇවිත් සමාව ගත්ත හැටි දිල්කිට මැවිලා පෙනුණා.

ඇගේ කතාවේ ආකෘතිය අද රෑම ලියන්න ඕන කියල දිල්කි තමන්ටම කියා ගත්තා.

**- අනුරුද්ධ වැලිගමගේ**

[anuruddhawe@yahoo.com]

# යුෂ්මතිය



එක අත්තේ ගිරවා හා ගිරවි ලෙසේ
විසූ බවක් නඩු ගොනුවෙන් මට පැවසේ
සිඳලනු කිම ද රැකි වෘතයක් මේ විලසේ?
දෙපසම සමයි මට තෙල ඇති තුලාව සේ

ස්වාමිනි එක් සැනින් පිරිසිඳ දකිනු එපා
සිරිතක් ලෙසට අත් බැඳුණයි කාගෙ දොසා
ඔබ කියනා වෘතය අප රැක්කා ද කියා
කෙලෙස කියමි මම් ලැජ්ජාව බය නිසා?

සෙවනැලි ඇදවුණේ කාගේ වරදින් ද?
නැදි මයිලන් කෙරේ යුතු සේ පැවතුනෙ ද?
සැම කාරණා පෙර සිරිතට දැක්වුයෙ ද?
හිමිආ කලට නිසි ලෙස පා දෙව්වා ද?

පා සෝදන්න ඔහු සනුවර සිටි බැවිනි
ගෙට ආවේ සතුටින්දැයි නොම දනිමි
කොයි වතුරෙත් වෙනසක් නම් ඔහු නොදනී
වතුර කාගෙ මුත් පා සොඳින් සේදුනි

සප්ත භාර්යා ගැන කියවා නොතිබිණි ද?
සියලුම වැරදි ඔහුහට පටවනු සරි ද?
දැල විදාහළ කල සිත හරි යා ද?
මෙහෙව් අඟනන්ට මොනවා පවසම් ද?

සප්ත භාර්යා අතරින් මා සිටියේ
වධක කොටසේ ලු උහු නිතරම මතුලේ
නාහෙට ගිලි ගිලී සැඩ දිය මහ ගැඹුරේ
දුටුවෙමි හීන නිල් රළ පෙළ සිත් සයුරේ

දෙඇස වැසූ සළුපට විනිවිද දකිමී
පැවසූ බස් අසා නීතිය පසිඳලමී
සභා දොරේ ලිහු මළු සොඳිනා දිටිමී
මසුරන් ඇවැසි නම් දෙන්නට අණ කරමී



තුලා කුමට රැකවරණය කිරන්නට
මසුරන් එපා දෙපසෙම වැරදියි බරට
වැරදී එසඳ එක අත්තේ වැසුවාට
දෙපසට යන්න දෙනු මැන අද සිට අපට

- **රූපිකා ද සිල්වා** [rupikadesilva88@gmail.com]

# කැලිෆෝනියාවේ දී ය

ඒ කාලයේ මතකය ගෙන අතගාමී
සිහරාජයේ සිසිලස අරගෙන නාමී
ගිම්හානයේ උණුසුම ඉන් පිසදාමී
කැලිෆෝනියාවේ කඳුවල බඩගාමී

දිව ගිලගෙනම එක වැහි බිඳකුදු නැතුව
ගහකොළ සිටින හැටි කිසි වගකුත් නැතුව
තණකොළ මොහොතකින් ඇවිළෙන්නට පැතුව
බල බල නගිමු කන්දට වෙහෙසින් යුතුව

ගින්නක් ඇති වුණොත් රැකවරණෙට මත්තේ
වියලුණු බිමේ ගිනි පටි කපලා ඇත්තේ
මව්රට සොඳුරුබව මතකෙට පැනගත්තේ
නිල්ලෙන් වැහුණු වන බිම් ඇත හැම පැත්තේ




සුළං කෝඩ දිවවිත් අඩුවක් නැතුව
ඇදන් දුවන තරමට වී බලගතුව
අරන් නැගුණු දූවිලි ඉහළට මතුව
බලන් ඉන්න සිදුවුණි කඳුලින් යුතුව

ගිම්හානයේ සරතැස දුක දරාගෙන
වස්සානයක් ළඟ නැති මුත් එබීගෙන
සිත්මානයේ සිතුවම් නෙක මවාගෙන
ඇස් මානයේ වන පස මල් පිපීගෙන

වමාරා කකා ඔහෙ කම්මැලි කමට
හරකුන් හිටියෙ කරවී කට්ට අව්වට
චිප් එල්ලා ඇතත් උන් හැමගෙ කන් යට
හණ ගැහු අකුරු මොකටද මන්ද උන් පිට

මුදුනට නැගී ඇස් යොමු කළා රවුමට
කුදු බව දැනුණි ඇතින් පෙනෙන රට තොට
හඳුනණ කිසිත් නැත එක වගේ වටපිට
කඳු යනු කිසිත් නොව පාඩම්ය අපහට

- **මාලිනී ගනේවත්ත** [mganewatta@gmail.com]



# ඔබට ඇසුන ද ප්‍රියේ



ආදරේ අරං එන වෙරළෙ රැලි මාලයේ
කිම තවම පිය නගා යන්නෙ ඔබ ජීවිතේ
සිහින මැද සැරිසරන සුසුම් පාවෙන රැයේ
පැතුම් මල් එකින් එක මිලිනවන හැටි පෙනේ


දරාගෙන සුසුම් රැල් කැටි වලාකුළු සැදී
එහෙ මෙහේ දුවනවා දඟකාර ලෙස ගැටී
රළ බිඳෙන සෝසාව ඉකිබිඳින'යුරු වැටී
ඔබ කීව වදන් ප්‍රතිරාව දෙයි හිත පිරී

පමාවී පැමිණෙන්න ඉඩක් තිබුන ද සිතේ
අළුත් දවසක් ගෙනෙන සඳ තවම තරඟයේ
ඔබ එදා ගැයු ගීයෙ පද දෙතොලෙ නිති සැලේ
රළ ගැයූ පිළිතුරත් ඔබට ඇසුනද ප්‍රියේ

**- නාලනී ද සිල්වා** [nalani.desilva006@gmail.com]

# ඒ ඔබයි





සඳ රෑ යාමයේ
සල රූ පෙරහැරේ
සිහිනයේ මතුවුනේ ඔබයි

වැහි පොදේ මතුවෙලා
සිත මගේ කැළඹුවේ
දේදුන්න වාගේ ම තමයි

රැළි නගා දිය මතින්
ඉරක් ඇඳුණා ලෙසින්
පාවෙලා ගිය බවත් සැබැයි

තිස් වසක් ගිය නමුත්
සයනයේ සිහිනයේ
ඉඳහිටක යළි රැඳී
ඉන්නවා නම් තමයි

රැළි ගැහුණු කම්මුලෙන්
සුද පෙනුණු කෙහෙ රොදින්
මුහුණු පොත් පිටු තුළින්
මතුවෙවී යන බවත් හැබැයි

උගුරටත් හොරකමින්
බොන බෙහෙත් වඩි ලෙසින්
ඇවිද යන ඒ මතක හරි හැඩයි

**- අනුරුද්ධ වැලිගමගේ**
[anuruddhawe@yahoo.com]

# නොකෙලෙසුනු යුවතිය

කොතෙක් හමුවේද මේ සංසාර ගමනෙ දී
ගැහැණුන්ට පිරිමින් ද,
පිරිමින්ට ගැහැණුන් ද,
රාගයක් ජනිත කරවන අපේ සිත් තුළ,
සිතින් යහන් ගතවන
එක් මොහොතකුදු නොපැකිළ?

පිටියුටිරි ග්‍රන්ථියෙන් ස්‍රාව වෑහේ නම්ල
අප කාටත් එය එසේ මැයි
නෑ කියන්නට නොහැකි මැයි!



ඒ නමුදු...
සිටියාය එක් සොඳුරු සඳ කිඳුරියක් මට නම්
සිහිනෙනිදු මගෙ යහනෙ ගුලි නොවූ,
ආදරයෙ අරුත මට කියා දුන්,
රාගයෙන් ආදරය පෙරා දුන්!

**- රංජිත් කිරිඇල්ල** [ran.kiri60@gmail.com]

# එකම අහසක



සඳවතක් අහසින් බසින්නට
වරම් ඉල්ලයි අහසකින්
බැස නොයන්නැයි අහස ඉල්ලයි
සඳ නැතිව පාළු වූ ඉතින්

එළිය පමණක් විඳ පුරුදු මුත්
එකම අහසක සැරිසරන්
කොහොම අහසක් දරා ගන්නද
සඳක් බැස ගිය පසු හොරෙන්

කඩා වැටුණට තරුත් ඉඳ හිට
නොගෙන අවසර අහසකින්
අහලා නෑ කිසි කලෙක කව්රුත්
කඩා වැටෙනවා පුන් සඳක්

දරා ගන්නට නොහැකිම නම්
බැහැලා යන විට සඳ වතක්
එළිය බලමින් ඉන්න වෙනවා
එකම අහසක සැරිසරන්

- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 සි | ති | 2 ම | ■ | 3 ක | න | 4 ක | ■ | 5 දූ | ම් | 6 ක | බ | 7 ල |
| කු | ■ | ගු | ■ | රු | ■ | ඳු | ■ | රා | ■ | ර් | ■ | සු |
| 8 රු | ව | ල් | නැ | ව | ■ | ■ | 9 අ | තී | ත | ම | ත | ක |
| ත | ■ | ගෙ | ■ | ල | ■ | 10 ති | ■ | ත | ■ | වි | ■ | ළ |
| 11 රු | සි | ය | න් | ■ | 12 බ | ත් | ■ | 13 ය | ස | පා | ල | ■ |
| ව | ■ | ■ | ■ | 14 හ | ■ | ත | ■ | ■ | ■ | ක | ■ | ■ |
| ■ | 15 ප | 16 ස | මි | තු | රා | ■ | 17 ක | 18 තා | නා | ය | ක | ■ |
| ■ | ■ | න් | ■ | ■ | ■ | 19 පි | ■ | ර | ■ | ■ | ■ | 20 කො |
| ■ | 21 ක | නි | ස | 22 ම | ■ | 23 රි | සි | ■ | 24 ස | 25 වි | ම | ත් |
| 26 සි | ■ | වේ | ■ | ල් | ■ | ත | ■ | 27 උ | ■ | ල | ■ | ත |
| 28 දූ | ර | ද | ක් | න | ය | ■ | ■ | 29 ප | ඩි | ක් | ක | ම |
| වී | ■ | න | ■ | ටු | ■ | 30 අ | ■ | මා | ■ | කු | ■ | ල් |
| 31 ම | ලි | ය | දේ | ව | ■ | 32 ග | ව් | ව | ■ | 33 ව | ල් | ලි |

**සිසිල ප්‍රහේලිකාව - සැප්තැම්බර් 2024 විසඳුම**

# ප්‍රේමණීය වසන්තය



නිවස උණුසුම් ය
රසකතා මැවේ නිරතුරු
රසමසවුළු ද ඇත
නෙක දසුන් වේ තිර මත
එනමුදු මේ කිසිවකවත් සුව නොදැනේ
ඔබේ උණුසුම තරම්

පත් වැරූ රුක් අතරින්
අඳුරු සෙවනැලි වැටුන මාවතට ඉහළින්
තරු නොමැති අහසේ අළු වළාකුළු මැද්දෙන්
හමා යන කුණාටු සුළඟ පරදා
බලා සිටියෙමි ඔබ එනතුරා
නෙක පැතුම් සිත දරා


ඔබ නැති මේ කුරිරු සමය
කියා දුනි මට පාඩම්
පන්නරය ලබන්නට ජීවිතේ මනරම්

ඒත් සිත විමසී නිරතුරුවම
එන්නේ ඔබ කවදා ද?
නොවක් උණුසුම රැගෙන
මා පැතුම් පුබුදන්න

තෙමසක් බලා සිටියෙමි
අහා, අද!
නොසිඳා මා පැතුම්
ඔබ ඇවිත් අරුණින්
හැකිය දැන් ඇරලන්න
අගුල් වූ නිවසේ පියන්පත්

- **මලී දිසානායක** [samanmalee7@hotmail.com]

# ගැලරිය



කාලෙකට පස්සෙ මම තුන්මාන ගැලරියේ
මගේ සුදු කණ්ණාඩි විසිවුණා කැළණියේ
එක ඇහැක නිල්පාට අනෙක් එක රතු වගේ
පන්දමක් ගෙන මාමා ඉන්දුවා ගැලරියේ

කාටූන් බලිකුරුටු දැකපු කොලු සන්දියේ
මේක නම් ජොලි වගේ තුන්මාන දෙයියනේ
මල් පිපෙයි සුවඳ එයි කළුවරේ මල්ලියේ
වෙරළු මල් පරවුණා ඒ අතර ගැලරියේ

තනි හිතට මල් පුසුඹ ඉමක් නැත මං වටේ
නෙළුම් මල් පිපෙනවා සෙලියුලොයිඩ් කඩතිරේ
අත්ගොඩක් නැති අපේ සරස්වති නංගිගේ
අත උඩත් නෙළුම් මල් පිපෙයි දෝ මේ වගේ

රැලි නගන මඩ වගුර උඩ සුදු ම ජලතලේ
හෙළු රජෙක් පැන දුවයි අතර මග සල්පිලේ
උඩු රැවුල මත රැඳුන මණිඅක්බ මල්ලිගේ
නෙළුම් මල් පරවුනා ඇස් පෙනෙන මායිමේ

**- අසංක ලක්නාත** [laknatha@laknatha.com]

# හුස්ම



හමායන වෙනස්වන
පිටස්තර සුළං රැල
නාසයෙන් ඇදගනී
මෙය නමින් හුස්ම වේ

හුස්ම වූ සුළං රැල
මම මගේ කරගනිමි
එය සිතේ මුළාවකි
එය වැරදි දැකීමකි
සුළං රැල ගලා යයි
හුස්ම ලෙස නම් කරයි
එය තමයි යතාර්ථය


ගලා යයි හුස්ම රැල
වෙනස් වෙයි හුස්ම රැල
ලබා දෙයි අම්ලකර
නිපදවයි නව රූප
ලබා දෙයි ප්‍රාණය



නිම කරයි කළයුක්ත
අරඹයි පසු ගමන්
පිටව යයි නාසයෙන්
සිද්ධිය මෙවන් වූ
සිදුවේ නිරන්තර
තිබෙන්නට ප්‍රාණය

කරන්නෙක් මෙතන නැත
ක්‍රියාවක් පමණ ඇත
කර්මයේ ඵලයකි
විපාකය නිමවෙයි
හුස්ම රැල නතර වෙයි
ප්‍රාණය නිමාවෙයි
යතාර්ථය එයම වේ

**- කළණ දිසානායක** [kalanadsl@gmail.com]




## සිසිල පොත් පුවත්

ඕස්ට්‍රේලියානු සහ නවසීලන්තවාසී කවි කිවිඳියන් කිහිප දෙනෙකුගේ නිර්මාණ රැගත් “පැහැසරණී” කාව්‍ය සංග්‍රහය දැන් සරසවි ප්‍රකාශනයක් ලෙස ලංකාවේ නිකුත් වී ඇත.

නිමල් සේදර විසින් සම්පාදිත මේ කාව්‍ය සංග්‍රහයට සිඩ්නි නගරයෙන් ඊවා වික්‍රමගේ, මහේෂා විජේසේකර, මෛත්‍රී පනාගොඩ, නිරන්ජන් සෙල්වදුරේ, සහ චම්පා බුද්ධිපාල, කැන්බරා නගරයෙන් සන්ධ්‍යා ලියනගේ, නවසීලන්තයෙන් චන්ද්‍රා සෙනෙවිරත්න, පර්ත් නුවරින් විජායි ලක්ෂ්මි මොහොට්ටි සහ බ්‍රිස්බේන් නුවරින් නිමල් සේදර දායක වී ඇත.

“පැහැසරණී” කාව්‍ය සංග්‍රහය දොරට වැඩීම සිඩ්නි නුවර දී සිදුකිරීමට අදහස් කෙරේ.

# බණ්ඩාරනායක සිහි වී

අටසිය අනූ නවයේ ජනවරි මාසේ
අටවෙනි දිනයෙ ඉපදී පා මදහාසේ
චන්දය ලබා මහ ජනතාවගෙ බෝසේ
පත්විය හතරවෙනි අගමැති ලෙස දේසේ

අම්මල තාත්තල ලඟ හිටියා ඇත්තූ
සිරිමා ඔහුගෙ බිරිඳයි අතින’ත ගත්තූ
දරුවන් තුන් දෙනෙකි ගම රට ජය ගත්තූ
හිටියේ එක්කෙනයි ඒ අතරින් පුත්තූ

පණස් හයේ මහ මැතිවරණෙදි උන්දා
රටවැසි වැඩිදෙනෙකු තම මතයට කැන්දා
අගමැති වෙලා නිල් පැහැයෙන් කොඩි බන්දා
පැවතුන රජයෙ තිබි මහ බලකණු බින්දා

අවුරුදු තුන හමාරක් යන්තමට වගේ
ගෙවෙමින් තිබුනු අවදියෙ පාලනය දිගේ
සැලසුම් කර තිබුනු ඒ වැඩ කොටසෙ අගේ
අකමැති අයත් හිටියා පහු කෙරුන යුගේ



නවසිය පණස් නවයේ අම්හිරි වරුසේ
සැප්තැම්බර් මාසෙ විසි පස්වෙනි දවසේ
සෝමාරාම තල්දූවේ හිමි විලසේ
මැරයෙක් ඇවිත් වෙඩි තැබුවා හොර රහසේ

රිවොල්වරය හංගා ගෙන සිවුර තුළ
කොළඹ හතේ ඒ ගෙදරට වැඩිය කල
දන් පැන් පුදන්නට මිස බිය සැකය තුළ
තිබුනේ නැහැ ඉඩක් ඒ මුළු නිවස තුළ

ඇඳුමෙන් පැලඳුමෙන් මිනිසෙකු මනින යුගේ
අදටත් ඉවර නැත අපෙ කරුමයට වගේ
දම් පද නිවැරදිව දැනගෙන ඉදිරි මගේ
යන්නට හැකි උනොත් එය කොපමණද අගේ?

එක එක කතා තිබුනත් මෙය පිටු පස්සේ
හාමුදුරුවරු අතිනුත් ගිණි අවි ගැස්සේ
බණ නම් ඇසේ පැය විසි හතරම තිස්සේ
එනමුදු කවුද තෙමුනේ සදහම් වැස්සේ

- **ආනන්ද ගුණතිලක** [a.gunatilake@hotmail.com]


සිසිල ගැන ඔබේ අදහස් දැන්වීමට
ඔබේ නිර්මාණ එවීමට

sisila.sangarawa@gmail.com

සිසිල පිටපත් ලබා ගැනීමට
අනුග්‍රාහක දැන්වීම් සඳහා






# පේස්තරයගෙ කතන්දර

**-විදූෂක**

## ක්ලාස් එකක කතාවක්



ක්ලාස් එකක් කියල කිව්වම ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තේරුම් දෙකක් තියෙනවා. එකක් තමයි රටේ හැමෝම දන්න ටියුෂන් ක්ලාස්. අනිත් ක්ලාස් වර්ගය තමයි විශ්වවිද්‍යාලයේ අවසන් විභාගය ඉතා ඉහලින් සමත් වෙන අයට ලැබෙන පංති සාමාර්ථ.

ඔය වගේ ක්ලාස් එකක් එක්ක උපාධිය ලබපු තරුණයෙක් රැකියාවක් හොයලා බැරිම තැන ගියා ලු පලාතේ දේශපාලුවා මුණ ගැසෙන්න. “සර් මං උපාධිදාරියෙක්. මට ක්ලාස් එකකුත් තියෙනවා” කියලා පොර කිව්වාම මන්තිරියා කිව්වාලු මෙහෙම.

“ඉතිං ඕයි, ක්ලාස් එකක් තියෙනවා ස්වයං රැකියාවක් හැටියට ඒ ක්ලාස් එක දියුණු කරගෙන ඉන්නවකෝ, රස්සා ඉල්ලලා ආණ්ඩුවෙ ඉහමොල කන්න හදන්නෙ නැතුව!”

අද මං කියන්න යන්නේ ඇත්තටම ස්වයං රැකියාවක් විදියට ඒ වගෙ ක්ලාස් එකක් කරපු පොරක් ගැනයි.

පොර බ්‍රයිටා. ඒ ලෙවල් විභාගෙත් ටොපේ ටොප් එකට පාස් වුණා. ගණිතයට තමයි පොර ඉතාමත් දක්ෂ. මිනිහ කැම්පස් යන්නත් කලින් ටියුෂන් ක්ලාස් කරන්න පටන්ගත්තා. ලොකු ටියුෂන් කඩ නෙමේ, නිකං එදා වේල හම්බ වෙන, අර ගෙවල්වලට ගිහින් කරන ජාතියෙ ක්ලාස්.

ඔය අස්සෙ පොරට සෙට් වුනා පිරිවෙනක මැත්ස් ක්ලාස් එකක් කරන්නත්. මිනිහ කැම්පස් එකේ වැඩයි, ටියුෂන් වැඩයි දෙකම අපූරුවට කරගෙන ගියා අවුලක් නැතුව.

ඔන්න දවසක් පොර කැම්පස් ඉඳල ගෙදර ගිහින් පිරිවෙනට ගියා මැත්ස් ක්ලාස් එක කරන්න. බස් එකේ ගිහින්, ටිකක් පරක්කු වුනු හින්ද කඩිනමින් ඇවිදගෙන ගිහින් පොර පන්සලට ගොඩවුනේ දාඩිය ඉහෙන්, කනෙන් පෙරාගෙන.

නායක හාමුදුරුවො පොරව දැකල තුවායක් දීල ළිඳ ළඟට යැව්ව මූණ කට හෝදගන්න. මැත්ස් ඒ වැඩේ ඉවර වෙලා පන්තියට යන්න යන කොටයි දැක්කෙ කොණ්ඩෙ හොඳටම අවුල් වෙලා කියල.

ඉතිං මෙහෙම යන්න බැනේ උගන්නන්න.

වහාම පොර ගියා නායක හාමුදුරුවන් ගෙ කාමරේ පැත්තට.

"සාදු තව උදව්වක් ඕනැ."

"මොකක්ද මහත්තයා?"

"සාදු මට පනාවක් දෙන්නකො කොණ්ඩෙ පීරගන්න."

නායක හාමුදුරුවන්ට බකස් ගාල හිනා ගියා.

"මං ලඟ කොයින්ද පනා මහත්තයො?" කියල ඇහුනමයි අපේ පොරට මතක් වුනේ හාමුදුරුවරු කොණ්ඩෙ තට්ටෙටම කොට කරල කපන බව. සාමාන්‍ය තරුණ සාදුලා නෙමේ, හරිය? මේ කියන්නේ වයසක නායක සාදුලා ගේ කොණ්ඩේ ගැන.

**- විදූෂක**

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික ගමුවේ ලේඛක සංසදය වෙනුවෙන් ග්ලෙන්මෝ පාර්ක්හි පදිංචි රසික හරිශ්චන්ද්‍ර සූරියආරච්චි විසින් සංස්කරණය කර 2024 ඔක්තෝබර් මස පළමුවෙනි දින ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ බෙදා හරින ලදී.

Edited and distributed by Rasika Harischandra Suriyaarachchi of Glenmore Park, New South Wales, Australia, on behalf of the Writers Guild of the Sinhalese Cultural Forum of NSW Inc on 1 October 2024.